සැ. යු.— 2006.09.08 දින පළ කරන ලද අංක 1,462 දරන *ගැසට් පත්‍රයේ* II කොටස සහ IV අ කොටස පළ නොකරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,463 - 2006 සැප්තැම්බර් 15 වැනි සිකුරාදා - 2006.09.15**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... .. | 1168 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — | රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | 1170 |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | 1160 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් .. ... ... | 1171 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | 1162 | විවිධ දැන්වීම් ... ... ... | — |

*සැ. යු.* .– ගෙවීම් උපක්‍රම වංචා පිළිබඳ පනත් කෙටුම්පත, 2006 ජුනි මස 16 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II *වැනි* කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

*(ii)* අක්‍රීය වත්කම් (ආපසු අයකර ගැනීමේ )පනත් කෙටුම්පත, 2006 ජුනි මස 16 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ* අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

*(iii)* ජාතික රක්ෂණ භාර අරමුදල පනත් කෙටුම්පත, 2006 ජුනි මස 16 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ* අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12 ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2006 සැප්තැම්බර් මස 22 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2006 සැප්තැම්බර් මස 08 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2006 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# බඩු බාහිරාදිය විකිණීම්

## අධිකරණ නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මඩකලපුව මහෙස්ත්‍රාත් අධිකරණයේ පවරන නඩුවලින් අයිතිකරුවන් නොමැති රාජසන්තක කරන ලද පහත විස්තර සඳහන් භාණ්ඩ 2006.09.30 වැනි දින පෙ. ව. 09.00 සිට ප. ව. 04.00 දක්වා මෙම අධිකරණයේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙම නඩු භාණ්ඩ සම්බන්ධයෙන් අයිතිය කියා සිටින යම් තැනැත්තෙකු වේනම් ප්‍රසිද්ධ වෙන්දේසිය ආරම්භ කිරීමට ප්‍රථම තම අයිතිය පිළිබඳ වූ ඉල්ලීම ඉදිරිපත් කළ යුතුය.

03. මෙම අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අනුමැතිය ඇතිව වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයයකට ප්‍රථම මහජනතාවට නඩු භාණ්ඩ පරීක්ෂාකර බැලිය හැක.

04. අපේක්ෂිත මිළ ඉල්ලීමක් ඉදිරිපත් නොවන ඕනෑම භාණ්ඩයක් වෙන්දේසියෙන් ඉවත්කිරීමට අධිකරණයට බලය ඇත.

05. භාණ්ඩ මිළ දී ගත් වහාම අදාළ මුදල ගෙවා අධිකරණ සංකීර්ණයෙන් භාණ්ඩ ඉවත්කර ගත යුතුය. ගෙවීම සඳහා චෙක්පත් භාරගනු නොලැබේ.

06. නඩු භාණ්ඩ මිළ දී ගන්නන් තම අනන්‍යතාව තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය.

එම්. එච්. එම් අජ්මීර්,
අතිරේක දිසා විනිසුරු හා මහෙස්ත්‍රාත්,
මඩකලපුව.

| අනුක්‍රමික අංකය | නඩු අංකය | | නඩු භාණ්ඩ පිළිබඳ විස්තර | ප්‍රමාණය |
|---|---|---|---|---|
| 01. | ඒ. ආර්. 64/06 (වා) | i | පාපැදි (අංකය නොමැත.) | 01 |
| | | ii. | පාපැදි (පී. සී. අයි. 65605 | 01 |
| 02. | ඒ. ආර්. 65/06 (වා). | i | 21″ රූපවාහිනී පලුදු වී ඇත | 01 |
| | | ii. | ගුවන්විදුලි යන්ත්‍ර පලුදුවී ඇත | 01 |
| | | iii. | සී. ඩී. ප්ලේයර් පලුදු වී ඇත. | 01 |
| | | iv. | සෝනි බොක්ස් පලුදු වී ඇත | 02 |
| 03. | ඒ. ආර්. 67/06 (වා) | | පාපැදි (අංකය 69280635) | 01 |
| 04. | ඒ. ආර්. 68/06 (වා) | | පොරව | |
| 05. | ඒ. ආර්. 183/06 | | පාපැදි (අංකය 9118690) | 01 |
| 06. | ඒ. ආර්. 348/05 | i. | රූපවාහිණී (සුනාමියෙන් පලුදු වී ඇත) | 04 |
| | | ii. | ශීතකරණ (පලුදුවී ඇත) | 01 |
| 07. | ඒ. ආර්. 349/05 | | ශීතකරණය (ක්‍රියාකාරී කොටස් නොමැති) | 01 |
| 08. | ඒ. ආර්. 350/05 | | රූපවාහිණී (සුනාමියෙන් පලුදු වී ඇත.) | 05 |
| 09. | ඒ. ආර්. 835/05 | | කොම්පියුටර් (සුනාමියෙන් පලුදු වී ඇත.) | 01 |
| 10. | ඒ. ආර්. 968/05 | i. | රූපවාහිණී (සුනාමියෙන් පලුදු වී ඇත) | 01 |
| | | ii. | කොම්පියුටර් මොනිටර් (සුනාමියෙන් පලුදු වී ඇත) | 02 |
| | | iii. | සීතකරණ (පලුදු වී ඇත) | 02 |
| 11. | ඒ. ආර්. 1109/05 | | වතුර පොම්ප (පලුදු වී ඇත) | 01 |
| 12. | ඒ. ආර්. 1470/05 | | කරාබු (කැරට් 20,0 05 මිලි ග්‍රෑම්ස් | 01 |
| 13 | ඒ. ආර්. 1918/05 | | ෆයිබර් බෝට්ටු (පලුදු වී ඇත) | 01 |
| 14. | ඒ. ආර්. 1919/05 | i. | ෆයිබර් (බෝට්ටු (පලුදු වී ඇත.) | 01 |
| | | ii. | බෝට්ටු එන්ජිම (පලුදු වී ඇත.) | 01 |
| 15. | ඒ. ආර්. 1998/05 | | බජාජ් වර්ගයේ යතුරුපැදි | 01 |
| | | | එන්ජින් අංකය ඩී. බී. එම්බීඑච්එල් 20375 | |
| | | | චැසි අංකය ඩීඩීඑෆ්බීඑච්එල් 58930 | |
| 16. | ඒ. ආර්. 2035/05 | i. | වලලු | 01 (ජෝඩු) |
| | | | කරාබු | 01 (ජෝඩු) |
| | | | පෙන්ඩන් | 01 |
| | | | මාල | 01 |
| | | | මුදු | 01 |
| | | | (කරට් 20, 31.5 ග්‍රෑම්ස්) | |
| | | ii. | තාලි (කැරට් 20, 4, 5 ග්‍රෑම්ස්) | 01 |
| | | iii. | කරාබු (කැරට් 20, 2.3 ග්‍රෑම්ස්) | 01(ජෝඩු) |
| | | iv. | මාල, කරාබු (කැරට් 20,20 ග්‍රෑම්ස්) | |
| | | v. | තාලි (කැරට් 20, 39 ග්‍රෑම්ස්) | 01 |
| | | vi. | වලලු (කැරට් 16, 13.4 ග්‍රෑම්ස්) | 01 |
| | | vii. | මාල (කැරට් 16,205 ග්‍රෑම්ස්) | 01 |
| | | viii. | කරාබු (කැරට් 18, 03 ග්‍රෑම්ස්) | 01(ජෝඩු) |
| | | ix. | මුදු (කැරට් 22, 6.3 ග්‍රෑම්ස්) | 01 |
| | | x. | තාලි (කැරට් 20, 40 ග්‍රෑම්ස්) | 01 |
| | | xi. | වලලු | 03 |
| | | | මුදු (කැරට් 20, 24.3 (ග්‍රෑම්ස්) | 02 |
| | | xii. | තාලි (කැරට් 20, 24 ග්‍රෑම්ස්) | 01 |
| | | xiii. | කරාබු (කැරට් 20, 1.5 ග්‍රෑම්ස්) | 01 |
| 17. | ඒ. ආර්. 2067/05 | | පාපැදි (අංක ඒ 3083) | 01 |
| 18. | ඒ. ආර්. 206805 | | පාපැදි (අංක එච් 5867265) | 01 |
| 19. | ඒ. ආර්. 2144/05 | | පාපැදි (අංක 55981966) | 01 |
| 20. | ඒ. ආර්. 2145/05 | | පාපැදි (69270106) | 01 |
| 21. | ඒ. ආර්. 2148/05 | | පාපැදි (24451397) | 01 |
| 22. | ඒ. ආර්. 2149/05 | | පාපැදි (ඒ 49628) | 01 |
| 23. | ඒ. ආර්. 2150/05 | | පාපැදි (එම් 839313) | 01 |
| 24. | ඒ. ආර්. 2163/05 | | හොන්ඩා වර්ගයේ සුපර්කප් 70 යතුරු පැදි | 01 |
| | | | එන්ජින් අංකය : සී 70ඊ 6573412 | |
| | | | චැසි අංකය : සී 70 6329495 | |
| 25. | ඒ. ආර්. 269/03 (වා) | i. | යමහ වර්ගයේ බෝට්ටු ඇන්ජින් | 01 |
| | | ii. | සුසුකි වර්ගයේ බෝට්ටු එන්ජින් | 01 |
| 26. | 2697/පීසී/03 (වා) | | පාපැදි (පීසීඅයි 8588 ඒ ඒ | 01 |
| 27. | 4215/පීසී/04/05(වා) | | ෆයිබර් ඔරු | 01 |
| 28. | 4537/එම්ටී/05/(වා) | | පාපැදි 24013833) | 01 |
| 29. | 38870/පීසී/00 | | පාපැදි (55991012) | 01 |

| අනුක්‍රමික අංකය | නඩු අංකය | | නඩු භාණ්ඩ පිළිබඳ විස්තර | ප්‍රමාණය |
|---|---|---|---|---|
| 30. | 54731/පීසී/03 | | වතුර මෝටර් | 01 |
| 31. | 61282/පීසී/05 | i. | පැනසොනික් වර්ගයේ රූපවාහිණී 14″ | 01 |
| | | ii. | පැනසොනික් වීසීඩී ප්ලේයර් | 01 |
| 32. | 63476/පීසී/05 | i. | පොඩි තැල්ල (කැරට් 16, 1.4 ග්‍රෑම්ස්) | 03 |
| | | ii. | පොඩි තැල්ල (කැරට් 18, 0.5 ග්‍රෑම්ස්) | 01 |
| 33. | 66740 ඕඩීඩී/05 | | පාපැදි (139116) | 01 |
| 34. | 69417/ඕඩීඩී/06 | | පාපැදි (වීසීඩී) 7421) | 01 |
| 35. | 69465/ඒජී/06 | i | උදලු | 01 |
| | | ii. | සවල් | 03 |
| | | iii. | පිකස් | 01 |
| 36. | 69898/එෆ්/06 | | සවල් | 05 |
| 37. | 69899/එෆ්/06 | i. | සවල් | 04 |
| | | ii. | පිකස් | 02 |
| 38. | නඩු අංකය නොමැත | | පිකර් නොමැති (බපල්) පෙට්ටි (උස අඩි 2 1/2″ හා පළල අඩි 1 1/2″) | 02 |
| 39. | නඩු අංකය නොමැත | | ඇම් ජේයර් | 01 |
| 40. | නඩු අංකය නොමැත | | යකඩ ලිපිගොනු තැබීමේ අල්මාරි (පලුදු වී ඇත.) | 01 |
| 41. | නඩු අංකය නොමැත | | සිවිලින් විදුලිපංකා (පලුදු වී ඇත.) | 05 |

09-508

---

## දිසා මහෙස්ත්‍රාත් අධිකරණය - වැලිමඩ

### 2006.09.30 දින වෙන්දේසියට නියමිත භාණ්ඩ ලේඛනය

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | |
|---|---|---|---|
| 01. | 65011 | සඳුන් දැව | කි. 50 යි |
| 02. | 65012 | – එම – | කි. 25 යි |
| 03. | 66928 | – එම – | කි. 10 යි |
| 04. | 66929 | – එම – | කි. 15 යි ග්‍රෑම් 900යි |
| 05. | ඒ. ආර්. 236 | – එම – | කි. 412 |
| 06. | 65837 | ඉයුු/රොබස්ටා<br>ඉයුු/සිට්ඩෝරා | දැව කැබලි 32 යි |
| 07. | 62343 | ඉයුකැලිප්ටස් ග්‍රාන්ඩිස් | දැව කැබලි 56 යි |
| 08. | 67357 | i. වෙලන් වර්ගයේ දැව කැබලි 08 යි<br>ii. ඉරුම් කියත් 01 යි | |
| 09. | 66301 | i. ඉයුකැලිප්ටස් ග්‍රාන්ඩිස් වර්ගයේ දැව කැබලි 04යි<br>ii ඉරුම් බැංකුවක්<br>iii කියත් තලයක් | |
| 10. | 66154 | i ටූනා වර්ගයේ ලී කැබැලි 03 යි<br>ii ඉරුම් බැංකුවක්<br>iii කියත් තලය | |
| 11. | 66153 | i ඉරුම් බැංකුවක්<br>ii කියත් තලය | |
| 12. | 53560 | අධිශීතකරණයක් | |
| 13. | 66177 | බාල්දි එකයි | |
| 14. | 66072 | බාල්දි එකයි | |
| 15. | 66184 | එම | |
| 16. | 67235 | එම | |
| 17. | 67239 | එම | |
| 18. | 67240 | එම | |



ජී. එල්. එන්. මයිමුනා මහත්මිය,
දිසා විනිසුරු සහ මහෙස්ත්‍රාත්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
වැලිමඩ.

2006 අගෝස්තු මස 22 වන දින,
වැලිමඩ දිසා අධිකරණයේ දී ය.

09 – 564

---

## පොලිස් අධිකාරී කාර්යාලය – රත්නපුර

රත්නපුර පොලිස් කොට්ඨාශයේ පොලිස් අධිකාරී කාර්යාලය සහ I, II III යන පොලිස් දිස්ත්‍රික්කයන්ට ඇතුළත් පොලිස් ස්ථානයන්හි පාවිච්චියට ගනු ලැබූ පහත සඳහන් ද්‍රව්‍යයන්/භාණ්ඩයන් 2006.09.30 වැනි සෙනසුරාදා පෙ.ව. 09.30 ට රත්නපුර පොලිස් අධිකාරී කාර්යාලයට අයත් භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. රත්නපුර පොලිස් අධිකාරී විසින් නියම කරන ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවන්හි වෙන්දේසි භාරකාර මණ්ඩලයේ අභිමතය පරිදි මෙම ද්‍රව්‍යයන්/භාණ්ඩයන් වෙන්දේසියෙන් ඉවත්කර ගැනීමේ අයිතිය එම මණ්ඩලය සතුව පවතී.

03. වෙන්දේසියෙන් මිළට ගනු ලබන ද්‍රව්‍යයන්/ භාණ්ඩයන් එම අවස්ථාවේදීම මුදල් ගෙවා එදිනම ප. ව. 06.00 ට පෙර පොලිස් කාර්යාල භූමියෙන් ඉවත්කර ගත යුතු අතර, සියලුම ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

04. වෙන්දේසියෙන් භාණ්ඩ මිළදී ගනු ලබන අය තම ජාතික හැඳුනුම්පත රැගෙන ආ යුතුය.

05. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීතුමාගේ නිසි අවසරය ලබාගෙන 2006.09.29 දින පෙ. ව. 10.30 සිට ප.ව. 03.30 දක්වා කාලය තුළ වෙන්දේසිවීමට නියමිත භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැක.

ජයන්ත කුලතිලක,
ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී,
රත්නපුර.

### වෙන්දේසියේ විකිණීමට නියමිතව ඇති භාණ්ඩ ලැයිස්තුව

| | භාණ්ඩයේ නම | ප්‍රමාණය |
|---|---|---|
| 01. | ඇළුමිනියම් කේතල් | 01 |
| 02. | උදලු තල | 04 |
| 03. | උළු කැට | 1910 |
| 04. | එකතු කිරීමේ යන්ත්‍ර | 10 |
| 05. | කතුරු | 01 |

| | භාණ්ඩයේ නම | ප්‍රමාණය |
|---|---|---|
| 06. | කෝප්ප ඇළුමිනියම් | 07 |
| 07. | කෝප්ප ඇනමල් | 07 |
| 08. | කේතල් ඇනමල් | 01 |
| 09. | තාච්චි | 02 |
| 10. | හිරමන | 01 |
| 11. | ලී අල්මාරි | 01 |
| 12. | ලාම්පු (හදිසි) | 01 |
| 13. | සාස්පාන් (ලොකු) | 05 |
| 14. | සාස්පාන් (කුඩා) | 11 |
| 15. | සයිකල් චේන් | 01 |
| 16. | මල්ටිපොට් | 01 |
| 17. | මුදල් පෙට්ටි | 01 |
| 18. | ඇඳුන් යකඩ | 07 |
| 19. | කේතල් (විදුලි) | 01 |
| 20. | පා පැදි පොම්ප | 01 |
| 21. | පා පැදි ලෝන් | 01 |
| 22. | පලමුදු | 12 |
| 23. | පුටු වානේ | 31 |
| 24. | පිහියා මේස | 01 |
| 25. | පුටු කැබලි | 09 |
| 26. | පුටු ඇඳි | 03 |
| 27. | පොරෝතල | 01 |

| | භාණ්ඩයේ නම | ප්‍රමාණය |
|---|---|---|
| 28. | පිඟන් ඇනමල් | 19 |
| 29. | පාපැදි | 07 |
| 30. | පිඟන් ඇලුමිනියම් | 26 |
| 31. | පුටු වානේ | 05 |
| 32. | සපත්තු බුරුසු | 01 |
| 33. | වතුර පිල්ටර් | 03 |
| 34. | විදුලි පංකා (මේස) | 02 |
| 35. | විදුලි පංකා (සිවිලිම) | 01 |
| 36. | බාල්දි (කුඩා) | 10 |
| 37. | බොයිලේරු | 07 |
| 38. | කැබිනෙට්ටු | 02 |
| 39. | ජෝගු කුඩා ඇනමල් | 30 |
| 40. | ජෝගු ඇනමල් ලොකු | 01 |
| 41. | ජනෙල් රෙදි මීටර් | 30 |
| 42. | කොකු ඇමුණුම් යන්ත්‍ර | 10 |
| 43. | කල්දේරම් (කුඩා) | 02 |
| 44. | කල්දේරම් (ලොකු) | 07 |
| 45. | රූපවාහිනී යන්ත්‍ර | 01 |
| 46. | යතුරුලියන (සිංහල) | 03 |
| 47. | යකඩ අල්මාරි | 01 |

09 – 563

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

## 2007 වර්ෂය සඳහා ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම් රේන්දය විකිණීම

2007 ජනවාරි මස 01 වැනි දින සිට 2007 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා කාලය තුළ පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම්වල පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාද මිල දී ගැනීම සඳහා 1982 අගෝස්තු 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද රා විකිණීමේ කොන්දේසිවලට ද යටත්ව 2006.10.20 වැනි දින පෙ.ව. 10.30 දක්වා මා විසින් ටෙන්ඩර්පත් කැඳවනු ලැබේ.

02. රා රේන්ද ලබාගැනීමට ඉදිරිපත් වන අය ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසියාකාරව සම්පූර්ණ කර මෙහි පහත දක්වා ඇති අනුමත රා තැබෑරුම් ලැයිස්තුවෙන් නියම කර ඇති ටෙන්ඩර් මුදල ගෙවා ලබාගත් චත්කම් සහතිකයක් ද සහිතව මුද්‍රා තබන ලද කවරයක බහා, කවරයේ වම් ඉහළ කෙළවරේ තමන් ටෙන්ඩර් කරනු ලබන තැබෑරුමෙහි අංකය හා නම ද පැහැදිලිව ලියා ඒ ඒ තැබෑරුම් සඳහා මෙහි දැක්වෙන ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන වේලාවට පෙර ලියාපදිංචි කරන ලද තැපෑලෙන් එවීමෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් ලුණුගල ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැලැස්විය යුතු ය.

03. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර් පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක් ම ටෙන්ඩර්කරුවන් සම්පූර්ණ අත්සන් යෙදීමෙන් සනාථ කල යුතු ය. එසේ නොවන ටෙන්ඩර්පත් භාරගනු නොලැබේ.

04. ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය වන 2006.10.20 වැනි දින පෙ.ව. 10.30 ට සියලුම ටෙන්ඩර්කරුවන් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

05. කිසියම් කරුණක් සටහන් නොකල ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍රිකා සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ලුණුගල ප්‍රාදේශීය ලේකම් සතු වේ.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2006.11.21 දින පෙ.ව. 10.00 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුය.

07. තනි වරප්‍රසාද මිලදී ගත් තැනැත්තා යයි ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව එසේ ප්‍රකාශ කල දින, එනම් රේන්ද විකුණූ දින ප.ව. 2.00 ට පෙර ලුණුගල ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදල වන මාස දෙකක මුදල් කොටසට වැඩි මුදලක් ඇප තැන්පත් වශයෙන් මා වෙත ගෙවා තැබෑරුම් පිළිබඳ කොන්දේසිවලට අත්සන් කල යුතු ය.

08. ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීමේ දී දැනගත යුතු වෙනත් විස්තර ඇත්නම් ඒවා ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකි වේ.

පී. එස්. පී. අබේවර්ධන,
ප්‍රාදේශීය ලේකම්,
ලුණුගල.

2006 ඔක්තෝබර් මස 23 වන දින,
ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය

*2007 වර්ෂය සඳහා අනුමත කරන ලද රා තැබෑරුම් ලැයිස්තු - ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය*
*2007.01.01 සිට 2007.12.31 දින දක්වා*

| *අනුක්‍රමික අංකය* | *තැබෑරුමේ නම සහ අංකය* | *කොට්ඨාශය* | *තැබෑරුම පිහිටවිය යුතු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *තැබෑරුම විවෘත කරන වේලාව* | *තැබෑරුම වසන වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල* | *ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය හා වේලාව* |
|---|---|---|---|---|---|---|---|
| 01. | ලුණුගල අංක 2 | ලුණුගල | පස්සර ප්‍රාදේශීය සභාවේ ලුණුගල උප කාර්යාලයේ කොට්ඨාස අංක 2හි වරිපනම් අංක 219 දරන කුරුළුකුඹුර වත්ත | පෙ. ව. 11.00<br>ප. ව. 5.00 | ප. ව. 2.00<br>ප. ව. 8.00 | රුපියල් 5000 | 2006.10.20<br>පෙ.ව. 10.30 |

මහදොව වත්තේ සීමාව තුළ 2007 වර්ෂය සඳහා රා කැන්ටින් බලපත්‍ර අලුත් කිරීමට එම වත්තේ වතු අධිකාරි විසින් ඔහුගේ නිර්දේශය 2006.10.20 වැනි දින හෝ එදිනට ප්‍රථම ලැබෙන සේ ලුණුගල ප්‍රාදේශීය ලේකම් වෙත එවිය යුතු ය.

09-632

---

## කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

### 2007 වර්ෂය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීම

2007 ජනවාරි 01 දින සිට 2007 දෙසැම්බර් 31 වැනි දින දක්වා කාලය තුළ පහත සඳහන් උපලේඛනයෙහි දක්වා ඇති කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, රා තැබෑරුම්වල පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාද මිළදී ගැනීම සඳහා 1982 අගෝස්තු 20 වෙනි දින, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද රා විකිණීමේ කොන්දේසි වලටද දැනට බලපවත්නා සියළුම සුරාබදු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලටද යටත්ව 2006.09.29 වෙනි දින පෙරවරු 10.30 දක්වා මවිසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

02. රා රේන්ද ලබා ගැනීමට ඉදිරිපත් වන අය ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසියාකාරව සම්පූර්ණ කර මෙහි පහත දක්වා ඇති අනුමත රා තැබෑරුම් ලැයිස්තුවෙන් නියම කර ඇති ටෙන්ඩර් මුදල ගෙවා, ලබාගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල කුවිතාන්සියක් ද, ප්‍රකාශිත රේන්ද කොන්දේසි පරිදි ලබා ගත් වත්කම් සහතිකයක් ද සහිතව මුද්‍රා තබන ලද කවරයක බහා, එහි මුදුනේ වම් කෙළවරේ තමන් "ටෙන්ඩර් කරනු ලබන තැබෑරුමේ අංකය සහ නම ද" පැහැදිළිව ලියා, ඒ ඒ තැබෑරුම් සඳහා මෙහි දැක්වෙන ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන වේලාවට පෙර ලියා පදිංචි කරන ලද තැපෑලෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් කටාන ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය.

03. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේදී ටෙන්ඩර් පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක්ම ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන යෙදීමෙන් සනාථ කල යුතුය. එසේ නොවන ටෙන්ඩර් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. ටෙන්ඩර්පත් භාරගන්නා අවසාන දිනය වන 2006.09.29 වැනි දින පෙරවරු 10.30 ට සියළුම ටෙන්ඩර්කරුවන් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

05. කිසියම් කරුණක් සටහන් නොකොට ඇති ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍රිකා සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය කටාන ප්‍රාදේශීය ලේකම් සතු වේ.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2006.11.01 දින පෙරවරු 10.30 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුය.

07. තනි වරප්‍රසාද මිළදී ගත් තැනැත්තා යයි ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව එසේ ප්‍රකාශ කළ දින එනම් රේන්ද විකුණූ දින පස්වරු. 2.00 ට පෙර කටාන ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදල වන මාස තුනක රේන්ද මුදල් කොටසට වැඩි මුදලක් ඇප තැන්පත් වශයෙන් ඔහුට ගෙවා තැබෑරුම් පිළිබඳ කොන්දේසිවලට අත්සන් කළ යුතුය.

08. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේදී දැනගතයුතු වෙනත් විස්තර ඇත්නම් ඒවා කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.

ඩබ්. ඒ. ඩී. පී. ලක්ෂ්මන්,
ප්‍රාදේශීය ලේකම්-කටාන.

2006 අගෝස්තු මස 24 වැනි දින,
කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| අනුක්‍රමික අංකය | තැබෑරුමේ නම සහ අංකය | කොට්ඨාශය | තැබෑරුම පිහිටුවිය යුතු ප්‍රාදේශීය කොට්ඨාශය | තැබෑරුම විවෘත කරන වේලාව | තැබෑරුම වසන වේලාව | ටෙන්ඩර් තැන්පත් මුදල | ටෙන්ඩර්භාර ගැනීමේ අවසාන දිනය හා වේලාව |
|---|---|---|---|---|---|---|---|
| 01. | මූකලන්ගමුව අංක 13 | කටාන | මූකලන්ගමුව ගමේ පමණක් | පෙ.ව. 11.00 ප.ව. 5.00 | ප.ව. 2.00 ප.ව. 8.00 | රු. 4000 | 2006.09.29 පෙ.ව. 10.00 |
| 02. | කටුනායක අංක 14 | කටාන | කටුනායක ගමේ පමණක් | පෙ.ව. 11.00 ප.ව. 5.00 | ප.ව. 2.00 ප.ව. 8.00 | රු. 4000 | 2006.09.29 පෙ.ව. 10.00 |
| 03. | ඇත්ගාල අංක 13 | කටාන | ඇත්ගාල ගමේ පමණක් | පෙ.ව. 11.00 ප.ව. 5.00 | ප.ව. 2.00 ප.ව. 8.00 | රු. 500 | 2006.09.29 පෙ.ව. 10.00 |
| 04. | නැ/කටාන අංක 24 | කටාන | නැ/කටාන ගමේ පමණක් | පෙ.ව. 11.00 ප.ව. 5.00 | ප.ව. 2.00 ප.ව. 8.00 | රු. 2000 | 2006.09.29 පෙ.ව. 10.00 |
| 05. | දෙමන්හන්දිය අංක 27 | කටාන | දෙමන්හන්දිය ගමේ පමණක් | පෙ.ව. 11.00 ප.ව. 5.00 | ප.ව. 2.00 ප.ව. 8.00 | රු. 2000 | 2006.09.29 පෙ.ව. 10.00 |

09-534

---

## හම්බන්තොට දිස්ත්‍රික්කයේ රා රේන්ද විකිණීම – 2007 වර්ෂය

2007 ජනවාරි මස 01 වන දින සිට 2007 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ පහත උපලේඛනයේ විස්තර සඳහන් රා තැබෑරුමේ පැසුනු රා සිල්ලරට විකිණීම සඳහා 1982.08.20 දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද රා රේන්ද විකිණීමේ කොන්දේසි වලට හා පොදුවේ සෑම සුරාබදු බලපත්‍රයක්ම වෙනුවෙන් දැනට බලපවත්නා හා ඉදිරියට බලපැවැත්විය හැකි කොන්දේසිවලට යටත්ව හම්බන්තොට දිස්ත්‍රික්කයේ පිහිටි අංක 01 දරන රා තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

02. ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රු. 5,000 ක් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට තැන්පත් කර ලබා ගත් නියමිත පෝරමය ඉදිරිපත් කල යුතුය. තවද ටෙන්ඩර්කරු විසින් පහත සඳහන් *ගැසට් නිවේදනයේ* පරිදි වත්කම් සහිත සහතික ටෙන්ඩර්කරුගේ නිශ්චල දේපල පිහිටි ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගෙන ටෙන්ඩර් පත්‍රයට ඇමිණිය යුතුයි.

03. සෑම ටෙන්ඩරයක්ම ටෙන්ඩර්කරුගේ නමින් ඉදිරිපත් කල යුතුය. නියෝජිතයකු විසින් හෝ ලාංකික නොවූ හා 1982.08.20 දින අංක 207 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද 1982 වර්ෂයේ රා රේන්ද විකිණීමේ කොන්දේසි යටතේ නුසුදුසු වන්නන්ගේ ටෙන්ඩර් පත්‍ර භාර ගනු නොලැබේ.

04. මෙම තැබෑරුම වෙනුවෙන් එක් අයෙකු විසින් එක් ටෙන්ඩරයකට වඩා ඉදිරිපත් කල නොහැකි අතර, පස්දෙනෙකුට වඩා හවුල් වන ටෙන්ඩර් පත්‍ර ද ඉදිරිපත් කල නොහැක.

05. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම කවරයක බහා සීල් තබා කවරයේ වම් පසු මුදුනේ "හම්බන්තොට දිස්ත්‍රික්කයේ අංක 01 දරන රා තැබෑරුමේ රේන්ද සඳහා ටෙන්ඩර් - 2007" යනුවෙන් පැහැදිළි ලෙස සඳහන් කළ යුතුය. ටෙන්ඩර් සහිත කවරය හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් හෝ ලියාපදිංචි තැපැලෙන් 2006.09.29 වන දින පෙ.ව. 10.00 ඉකුත් වීමට පෙර ලැබෙන සේ ඉදිරිපත් කල යුතුය. ටෙන්ඩර් වසන වේලාවේදී සියළුම ටෙන්ඩර්කරුවන් හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැමිණ සිටිය යුතුය.

06. සාර්ථක වූ ටෙන්ඩර්කරු විසින් ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දැන් වූ විට රේන්දය විකිණීමේ කොන්දේසිවලට අත්සන් කර හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් විසින් ඇප තැන්පත් වශයෙන් නියම කරනු ලබන මුදලක් ගෙවිය යුතුයි.

07. ටෙන්ඩර් පත්‍රයේ හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර හෝ නියමිත හේතුන් නොදන්වා ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ බලය හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් වෙත පැවරී ඇත.

08. කිසියම් හේතුවක් නිසා ටෙන්ඩර් භාර ගැනීමට නියමිත 2006.09.29 වන දිනට අවලංගු කිරීමට සිදුවුවහොත් නැවත ටෙන්ඩර් භාර ගන්නා දිනය 2006.10.16 වන දින වේ.

09. වැඩි විස්තර හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් දැන ගත හැකිය.

ඩී. එස්. පත්මකුලසූරිය,
ප්‍රාදේශීය ලේකම්,
හම්බන්තොට.

2006 අගෝස්තු මස 07 වැනි දින,
හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

**2006 වර්ෂයට හම්බන්තොට දිස්ත්‍රික්කයේ අනුමත කරන ලද රා තැබෑරුම**

| *අනුක්‍රමික අංකය* | *කොට්ඨාශය* | *ග්‍රාමය* | *ටෙන්ඩර්පත් භාර ගැනීම* | *තැබෑරුම විවෘතව තිබිය තැබිය යුතු වේලාවන්* |
|---|---|---|---|---|
| 01 | හම්බන්තොට | හම්බන්තොට | 2006.09.29 පෙ. ව. 10.00 | පෙ.ව. 11.00 සිට ප.ව. 2.00 දක්වා සහ ප. ව. 5.00 සිට ප. ව. 8.00 දක්වා |

09-611

---

## නාරම්මල ප්‍රාදේශීය මහ ලේකම් කොට්ඨාසය

### 2007 වර්ෂය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීම

2007 ජනවාරි මස 01 වැනි දින සිට 2007 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලය තුළ පහත සඳහන් උපලේඛනයන්හි දක්වා ඇති රා තැබෑරුමේ පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාදය මිලදී ගැනීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන *ගැසට් පත්‍රයේ* සුරාබදු කොමසාරිස්වරයා විසින් පළ කරන ලද රා විකිණීමේ කොන්දේසිවලට, යටත්ව 2006 ඔක්තෝබර් මස 05 වැනි දින පෙ. ව. 10.30 දක්වා නාරම්මල ප්‍රාදේශීය ලේකම් විසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

02. රා රේන්ද මිලදී ගැනීම සඳහා ඉදිරිපත් වන අය ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසි පරිදි සම්පූර්ණ කොට, මෙහි පහත දැක්වෙන උපලේඛනයෙන් නියම කොට ඇති ටෙන්ඩර් තැන්පත් මුදල මෙම කාර්යාලයට හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ගෙවා ලබා ගන්නා ලද කුවිතාන්සිද, ඉහත දක්වා ඇති *ගැසට් නිවේදනයේ* වන රා විකිණීමේ කොන්දේසිවල දැක්වෙන පරිදි, ලබාගත් චරිත්‍ර සහතිකයක්ද, සහිතව කවරයක බහා, එයට මුද්‍රා තබා එහි මුදුනේ වම් කෙළවරේ තමන් ටෙන්ඩර් කරන තැබෑරුමේ අංකය සහ නමද, පැහැදිලිව ලියා උපලේඛනයේ දැක්වෙන අවසාන වේලාවට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මේ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් නාරම්මල ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැලැස්විය හැක.

03. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පත් සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර් පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක් සඳහාම ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන යෙදීමෙන් සනාථ කළ යුතුයි. එසේ නොවන ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය වන 2006 ඔක්තෝබර් මස 05 වැනි දින පෙ. ව. 10.30ට සියලුම ටෙන්ඩර්කරුවන් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුයි.

05. කිසිම කරුණු දැන්වීමක් නොකොට ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍රිකා සියල්ල ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය නාරම්මල ප්‍රාදේශීය ලේකම් සතුවේ.

06. තනි වරප්‍රසාද මිලදී ගත් තැනැත්තා යැයි ප්‍රකාශයට පත් කිරීමෙන් පසු සාර්ථක ටෙන්ඩර්කරු විසින්, එසේ ප්‍රකාශ කළ දින ප. ව. 3.00ට පෙර නාරම්මල ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදලක් ආරක්ෂිත ඇප තැන්පත් වශයෙන් ගෙවා විකුණුම් කොන්දේසිවලට අත්සන් කළ යුතුය.

07. 2007 වර්ෂය සඳහා දැනට රා තැබෑරුම් ඇති ස්ථානය ලබාදීමට සහතික වනු නොලැබේ. දැනට රා තැබෑරුම් පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල 2007 වර්ෂය සඳහා නොලබන්නේ නම් ඒ වෙනුවට තෝරාගත් අලුත් ස්ථානයේ යෝග්‍යතාවය පිළිබඳව ටෙන්ඩරය ප්‍රදානය කළ දින සිට දින 30ක් ඇතුළත සාර්ථක ටෙන්ඩර්කරු විසින් ඒ සඳහා නාරම්මල ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතියද ලබාගත යුතුයි.

08. 2006 ඔක්තෝබර් මස 05 වැනි දින රේන්දය විකිණීමෙහිලා සතුටුදායක ඉල්ලීම් නොතිබුණහොත්, 2006 නොවැම්බර් මස 07 වැනි දින පෙ. ව. 10.30ට නැවත රේන්ද විකිණීම මේ ස්ථානයේ දී පවත්වනු ලැබේ.

09. වැඩි විස්තර අවශ්‍ය නම් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.

එල්. එච්. රම්‍යසිරි,
ප්‍රාදේශීය ලේකම්,
නාරම්මල.

2006 අගෝස්තු මස 28 වැනි දින,
නාරම්මල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය

| *අනුක්‍රමික අංකය* | *කොට්ඨාශය* | *ටෙන්ඩර්පත් භාරගන්නා අවසාන දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* | *රා තැබෑරුම විවෘත කරන වේලාව* | *තැබෑරුම වැසිය යුතු වේලාව* |
|---|---|---|---|---|---|
| 01 | නාරම්මල | 2006.10.05<br>පෙ. ව. 10.30ට පෙර | 1,000 | පෙ. ව. 11.00<br>ප. ව. 05.00 | ප. ව. 02.00<br>ප. ව. 08.00 |

09-612

---

## උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

### රා තැබෑරුම් රේන්ද විකිණීම - 2007 වර්ෂය

2007 ජනවාරි 01 සිට 2007 දෙසැම්බර් 31 දක්වා වූ කාලය තුළ පහත සඳහන් උපලේඛනයෙහි දක්වා ඇති රා තැබෑරුමේ පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාදය මිළදී ගැනීම සඳහා 1982 අගෝස්තු මස 20 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන *ගැසට් පත්‍රයේ* සුරාබදු කොමසාරිස්වරයා විසින් පළකරන ලද රා විකිණීමේ කොන්දේසිවලටද, දැනට බලපවත්නා සියළු සුරාබදු කොන්දේසිවලට හා පහත සඳහන් කොන්දේසිවලට ද යටත්ව 2006 ඔක්තෝබර් මස 09 වන දින පෙ. ව. 10.30 දක්වා උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් විසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

02. රා රේන්ද මිළදී ගැනීමට ඉදිරිපත් වන අය ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘත පත්‍රයක් නිසි පරිදි සම්පූර්ණ කොට මෙහි පහත දැක්වෙන උපලේඛනයේ නියම කොට ඇති ටෙන්ඩර් තැන්පත් මුදල ගෙවා ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක සරප්ගෙන් ලත් මුදල් කුවිතාන්සියක්ද, ඉහත දක්වා ඇති *ගැසට් නිවේදනයේ* වන රා විකිණීමේ කොන්දේසිවල දැක්වෙන පරිදි ලබාගත් වත්කම් සහතිකයක්ද, සහිතව කවරයක බහා එයට මුද්‍රා තබා එහි ඉහළ වම් කෙළවරේ තමන් ටෙන්ඩර් කරන තැබෑරුමේ අංකය සහ නමද පැහැදිලිව ලියා උපලේඛනයේ දැක්වෙන අවසාන වේලාවට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැලැස්විය හැක.

03. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පත් සම්පූර්ණ කිරීමේදී ටෙන්ඩර් පත්‍රවල කරන සෑම වෙනස්වීමක්ම ටෙන්ඩර්කරුගේ අත්සන යෙදීමෙන් සනාථ කළ යුතුය. එසේ නොවන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය වන 2006 ඔක්තෝබර් මස 09 වන දින පෙ. ව. 10.30 ට සියළුම ටෙන්ඩර්කරුවන් උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය

05. කිසිම කරුණු දැන්වීමක් නොකොට ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍රිකා සියල්ල ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් සතුවේ.

06. තනි වරප්‍රසාදය මිළදීගත් තැනැත්තා යයි ප්‍රකාශයට පත්කිරීමෙන් පසුව සාර්ථක ටෙන්ඩර්කරු විසින් එසේ ප්‍රකාශ කළ දින ප. ව. 200 ට පෙර උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදලක් ආරක්ෂිත ඇප තැන්පත් වශයෙන් ගෙවා විකුණුම් කොන්දේසිවලට අත්සන් කළ යුතුය.

07. 2007 වර්ෂය සඳහා දැනට රා තැබෑරුම ඇති ස්ථානය ලබාදීමට සහතික වනු නොලැබේ. දැනට රා තැබෑරුම පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල 2007 වර්ෂය සඳහා නොලැබෙන්නේ නම් ඒ වෙනුවට තෝරාගත් අලුත් ස්ථානයේ යෝග්‍යතාවය පිළිබඳ ටෙන්ඩර් ප්‍රදානය කළ දින සිට දින 30 ක් ඇතුළත සාර්ථක ටෙන්ඩර්කරු විසින් ඒ සඳහා උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම්ගෙන් අනුමැතිය ලබාගත යුතුය.

08. 2006 ඔක්තෝබර් මස 09 වෙනි දින රේන්ද විකිණීමේ ලා සතුටුදායක ඉල්ලීම් නොතිබුණහොත් 2006 නොවැම්බර් මස 08 වන දින පෙ. ව. 10.30 ට නැවත රේන්ද විකිණීම මේ ස්ථානයේදී පවත්වනු ලැබේ.

09. වැඩි විස්තර අවශ්‍ය නම් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.

එච්. එල්. එස්. විජේසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
උඩුබද්දාව.

2006 ක් වූ අගෝස්තු මස 23 වැනි දින,
උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය

උපලේඛනය

උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අනුමත රා තැබෑරුම් 2007 වර්ෂය

| *අංකය හා නම* | *පත්තුව* | *තැබෑරුම් විවෘත කළ යුතු ප්‍රදේශය* | *ටෙන්ඩර් තැන්පත් මුදල* | *ටෙන්ඩර් වසන වේලාව හා දිනය* | *තැබෑරුම විවෘත කළ යුතු වේලාව* | *තැබෑරුම වැසිය යුතු වේලාව* |
|---|---|---|---|---|---|---|
| උඩුබද්දාව අංක 02 | කටුගම්පල හත්පත්තුව | උඩුබද්දාව ගම තුල | රු. 250.00 | 2006.10.09 පෙ.ව. 10.30 | පෙ.ව.11.00 සහ ප.ව. 5.00 | ප.ව.2.00 සහ ප.ව. 8.00 |

09-565

---

දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

2007 වර්ෂය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීම

2007 ජනවාරි මස 01 වැනි දින සිට 2007 දෙසැම්බර් මස 31 දින දක්වා කාලය තුළ පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රා තැබෑරුම් වල පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාද මිල දී ගැනීම සඳහා 1982 අගෝස්තු 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද රා විකිණීමේ කොන්දේසි වලටද පහත සඳහන් කොන්දේසි වලටද යටත්ව 2006.10.02 දින පෙ. ව. 10.30 දක්වා මා විසින් ටෙන්ඩර්පත් කැඳවනු ලැබේ.

02. රා රේන්ද ලබා ගැනීමට ඉදිරිපත් වන අය ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසියාකාරව සම්පූර්ණ කර මෙහි පහත දක්වා ඇති අනුමත රා තැබෑරුම් ලැයිස්තුවෙන් නියම කර ඇති ටෙන්ඩර් මුදල ගෙවා ලබා ගත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල කුවිතාන්සියක් ද, ප්‍රකාශිත රේන්ද කොන්දේසි මත ලබාගත් වත්කම් සහතිකයක් ද සහිතව මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරේ තමන් ටෙන්ඩර් කරනු ලබන තැබෑරුම් අංකය සහ නමද පැහැදිළිව ලියා ඒ ඒ තැබෑරුම් සඳහා මෙහි දැක්වෙන ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන වේලාවට පෙර ලියාපදිංචි කරන ලද තැපැලෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය.

03. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර්පත් සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර් පත්‍රවල පළ කරනු ලබන සෑම වෙනස් කිරීමක් ම ටෙන්ඩර් කරුවන්ගේ සම්පූර්ණ අත්සන් යෙදීමෙන් සනාථ කළ යුතුය. එසේ නොවන ටෙන්ඩර් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනය වන 2006.10.02 වැනි දින පෙ. ව. 10.30 ට සියළුම ටෙන්ඩර්කරුවන් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුය.

05. කිසියම් කරුණක් සඳහන් නොකොට ඇති ටෙන්ඩර් පත්‍රිකාව හෝ පත්‍රිකා සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් සතුවේ.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2006.11.02 දින පෙ. ව. 10.30 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුය.

07. මේ වරප්‍රසාද මිලදීගත් තැනැත්තා යැයි ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව එකී ප්‍රකාශ කල දින එනම් රේන්ද විකුණුම් දින පස්වරු 2.00 ට පෙර දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදලින් මාස දෙකක රේන්ද මුදල් කොටසකට වැඩි මුදලක් ඇප තැන්පත් වශයෙන් ඔහුට ගෙවා තැබෑරුම් පිළිබඳ කොන්දේසිවලට අත්සන් කළ යුතුය.

08. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේදී දැනගත යුතු වෙනත් විස්තර ඇත්නම් ඒවා දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.

යූ. ඒ. එස්. පෙරේරා,
ප්‍රාදේශීය ලේකම්,
දිවුලපිටිය.

2006 අගෝස්තු මස 28 වැනි දින,
දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය

| *අනුක්‍රමික අංකය* | *තැබෑරුමේ නම සහ අංකය* | *කොට්ඨාසය* | *තැබෑරුම පිහිටුවිය යුතු ප්‍රාදේශීය කොට්ඨාසය* | *තැබෑරුම විවෘත කරන වේලාව* | *තැබෑරුම වසන වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල* | *ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය හා වේලාව* |
|---|---|---|---|---|---|---|---|
| 01 | දාගොන්න-27 | දිවුලපිටිය | දාගොන්න | පෙ.ව.11.00 ප.ව. 5.00 | ප.ව. 2.00 ප.ව. 8.00 | රු. 4,000 | 2006.10.02 පෙ.ව. 10.30 |

09-572

# ආණ්ඩුවේ නොවන දැන්වීම්

## නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීම

වැල්ලව, මකුල් කොටුව වත්තේ පදිංචි හසිත ජනරංජන දයාරත්න වන මම කුරුණෑගල දිස්ත්‍රික්කයේ, සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු වශයෙන් ඇතුළත් වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම පිණිස නොතාරිස් ආඥා පනතේ 107 වන අධිකාරයේ 7 වන වගන්තිය ප්‍රකාර මෙතැන් සිට මාසයක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් අවසර ඉල්ලා සිටින බව මෙයින් දන්වා සිටිමි.

හසිත ජනරංජන දයාරත්න.
නොතාරිස් ප්‍රතිඥාත ලිපිකරු.

2006 අගෝස්තු මස 28 වැනි දින,
මකුල් කොටුව වත්ත,
වැල්ලව.

09–520

---

## නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීම

කුරුණෑගල, තෙලියගොන්න, නුවර පාරේ., අංක 395 පදිංචි, සේගු අබ්දුල් කාදර් ෆාතිමා කිෂාර් වන මම කුරුණෑගල දිස්ත්‍රික්කයේ, සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් වරියක වශයෙන් ඇතුළත් වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම පිණිස නොතාරිස් ආඥා පනතේ 107 වන අධිකාරියේ 7 වගන්තිය ප්‍රකාර මෙතැන් සිට මාසයක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් අවසර ඉල්ලා සිටින බව මෙයින් දන්වා සිටිමි.

සේගු අබ්දුල් කාදර් ෆාතිමා කිෂාර්,
නොතාරිස් ප්‍රතිඥාත ලිපිකරු.

2006 අගෝස්තු මස 28 වැනි දින,
අංක 395, නුවර පාර,
තෙලියගොන්න,
කුරුණෑගල.

09–521

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

මීරිගම, රුක්සෙවනහි පදිංචි අල්ගමගේ තිරිස් ජොසපින් සමරනායක වන මා, ඇටෝර්නි අධිපති හැටියට, මිනුවන්ගොඩ, පත්තඩුවන පදිංචි හෙට්ටිගේ තිරිස් ලක්ෂිකා අයන්ති පෙරේරා යන අය ඇටෝර්නි බලකරු කරමින් ප්‍රසිද්ධ නොතාරිස් එන්. ඒ. කේ. බී. එල්. ධර්මසේන මහතා ලියා සහතික කල අංක 416 සහ 2002.02.29 දිනැති ඇටෝර්නි බලපත්‍රය අවලංගු කල බව සියලු දෙනාගේම දැන ගැනීම පිණිස මෙයින් දන්වමි.

අල්ගමගේ තිරිස් ජොසපින් සමරනායක.

09–504

---

## නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීම

කෙසෙල්වත්ත, ගොරකාන, ගාළු පාර, අංක 415/1, තැන පදිංචි ආඩම්බරගේ සුජීවා කුමාරි ද අල්විස් වන මම, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් වරියක වශයෙන් ඇතුළත්වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම පිණිස නොතාරිස් ආඥාපනතේ 107 වන අධිකාරියේ 7 වන වගන්තිය ප්‍රකාර මෙදින සිට මාසයක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල් තුමාගෙන් ඉල්ලා සිටින බව මෙයින් දන්වා සිටිමි.

ඒ. එස්. කේ. අල්විස්.

2006 සැප්තැම්බර් මස 01 වැනි දින,
අංක 415/1, ගාළු පාර,
ගොරකාන,
කෙසෙල්වත්ත.

09–652

---

## නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීම

පුත්තලම දිස්ත්‍රික්කයේ, නාත්තන්ඩිය, දුන්කන්නාව, උණපදුර පාර, ‘අනුරුද්ධ’ නිවසේ පදිංචි දිසානායක මුදියන්සේලාගේ පද්මිණී සුජාතා වන මම පුත්තලම, දිස්ත්‍රික්කයේ, සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස්වරියක වශයෙන් ඇතුළත් වීම සඳහා නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම පිණිස නොතාරිස් ආඥා පනතේ 107 වන අධිකාරියේ 7 වගන්තිය ප්‍රකාර මෙදින සිට මාසයක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් අවසර ඉල්ලා සිටින බව මෙයින් දන්වා සිටිමි.

ඩී. ඇම්. පද්මිණී සුජාතා.

2006 අගෝස්තු මස 28 වැනි දින.

09–631

---

## නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීම

පමුණුගම, ‘සිරිනිල’ හි පදිංචි ජයකොඩිආරච්චිගුරුනාන්සෙලාගේ දොන් සිරිල් ජුවන් සෙකුන්දාරියුස් නානායක්කාර වන මම ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව මහ අධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු වශයෙන් ඇතුළත්වීම පිණිස නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා වූ අවසරය 107 වන අධිකාරය වන නොතාරිස්වරු නම්වූ ආඥාපනතේ 7 වැනි වගන්තිය ප්‍රකාරව මෙදින සිට මසක් ඉකුත් වූ පසුව රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව සියලු දෙනාටම මෙයින් දන්වා සිටිමි.

ජේ. ඩී. සී. ජේ. එස්.නානායක්කාර.

2006 අගෝස්තු මස 30 වැනි දින,
‘සිරිනිල’
පමුණුගම.

09–556

## නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීම

කඩවත, කෝපිවත්ත, අංක 133 හි පදිංචි හෙට්ටි මුහම්දිරම්ගේ හේමාලි හේමමාලා වික්‍රමසිංහ වන මම ගම්පහ දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස්වරියක වශයෙන් ඇතුළත් වීම පිණිස නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා නොතාරිස් ආඥා පනතේ 107 වන අධිකාරයේ 7 වන වගන්තිය ප්‍රකාර මෙදින සිට මාසයක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව සියලු දෙනාම වෙත මෙයින් දන්වා සිටිමි.

එච්. ඇම්. එච්. හේමමාලා වික්‍රමසිංහ.

2006 අගෝස්තු මස 29 වැනි දින,
අංක 133,
කෝපිවත්ත,
කඩවත.

09-531

---

## නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීම

කඩවත, මහර නුගේගොඩ, අංක 417/බී හි පදිංචි දුල්මිණී විතානගේ වන මම ගම්පහ දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු වශයෙන් ඇතුළත් වීම පිණිස නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා නොතාරිස් ආඥා පනතේ 107 වන අධිකාරයේ 7 වන වගන්තිය ප්‍රකාර මෙදින සිට මාසයක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව සියලු දෙනාම වෙත මෙයින් දන්වා සිටිමි.

දුල්මිණී විතානගේ.

2006 අගෝස්තු මස 29 වැනි දින,
අංක 417/බී,
මහර නුගේගොඩ,
කඩවත.

09-532

---

## ඇටර්නි බලකරය අවලංගු කිරීම

රාජගිරිය, ඔබේසේකරපුර, මොරගස්මුල්ල පාර, අංක 215/4, දරන ස්ථානයේ පදිංචි, බ්‍රහක්මනගම ඇල්විටිගලගේ ශ්‍රීයාලතා වන මම, රාජගිරිය, ඔබේසේකරපුර, ස්කන්ධ දේවාල මාවත, අංක 7/27 දරන ස්ථානයේ පදිංචි, මාලිගොඩ පතිරනගේ දීපිකා ප්‍රියන්ති යන අයට ප්‍රසිද්ධ නොතාරිස් එස්. චන්ද්‍රා සිල්වා මහතා 1999.11.01 වන දින ලියා සහතික කල අංක 4354 දරන ඇටර්නි බලකරයෙන් දී තිබූ සියළුම බලතල මෙයින් අවලංගු කර සිටින බව උතුම් වූ ශ්‍රී ලංකා ආණ්ඩුවටත්, සියළුම ශ්‍රී ලංකාවාසී ජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

බ්‍රහක්මනගම ඇල්විටිගලගේ ශ්‍රීයාලතා.

09-533

---

## ඇටර්නි බලය අවලංගු කිරීම

මහනුවර, බෝවල, බෝධියංගන මාවතේ, අංක 92/1බී දරන ස්ථානයේ පදිංචි ශිරානි මල්කාන්ති පෙරේරා වික්‍රමසිංහ යන මම, යූ. ඒ. ප්‍රේමසුන්දර කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් මහතා සහතික කළ අංක 2246 සහ 2004.06.10 දින දරන ඇටර්නි බලකරය මගින් තලවතුගොඩ, වීරසේකර මාවතේ, අංක 15 දරන ස්ථානයේ පදිංචි උපාලි ලියනගේ මාගේ ඇටර්නි බලකරු ලෙස පත් කළ අතර, එකී පත් කිරීම මා විසින් ප්‍රත්‍යාදිෂ්ඨ කර අවලංගු කරන ලද බව මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට සහ මහජනතාවට මෙයින් දැනුම් දෙමි.

එනිසා උපාලි ලියනගේ විසින් මාගේ ඇටර්නි බලකරු ලෙස මා නමින් සහ /හෝ මා වෙනුවෙන් කරනු ලබන කිසිදු ක්‍රියාවක් සඳහා මා වග නොකියන බව මම මෙයින් දැනුම් දෙමි.

ශිරානි මල්කාන්ති පෙරේරා වික්‍රමසිංහ.

09–588

---

## නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීමට පෙරාතුව කරනු ලබන දැන්වීම

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, සඳලංකාව තැපැල් හෙණ්ඩියගල පදිංචි හේරත් පතිරන්නැහෙලාගේ ජයසිරි හේරත් පතිරණ වන මම, එම දිස්ත්‍රික්කයේ සිංහල භාෂාවෙන් කටයුතු කරන ප්‍රසිද්ධ නොතාරිස් වරයෙකු වශයෙන් ඇතුළත් වීම සඳහා, නොතාරිස් අවසාන පරීක්ෂණයට පෙනී සිටීම පිණිස 107 වන අධිකාරයේ 07 වන වගන්තිය ප්‍රකාර මෙදින සිට මසක් ඉකුත් වූ පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලා සිටින බව සියලු දෙනාම වෙත මෙයින් දන්වා සිටිමි.

එච්. ජී. ජේ. එච්. පතිරණ.

2006 අගෝස්තු මස 15 වැනි දින,
හෙන්ඩියගල,
සඳලංකාව.

09-590

# රට බිම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම්පත්

## මහනුවර දිස්ත්‍රික්කයේ දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති අංක 03 පට්ටියගම විදේශ මත්පැන් තැබෑරුම

2007 වර්ෂය සඳහා රේන්ද විකිණීම

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කළ 1983 වර්ෂය හා ඊට පසු කාලපරිච්ඡේදය සඳහා විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි වලටත්, එම කාලය තුළදී වලංගු සෑම සුරාබදු බලපත්‍රයක් කෙරෙහිම බලපාන පොදු සුරාබදු කොන්දේසිවලටත් මත්පැන් සිල්ලරට විකිණීමේ වරප්‍රසාදයක් මිල දී ගැනීම සඳහා දෙල්තොට ප්‍රාදේශීය ලේකම්/අතිරේක දිසාපති තැන වන මා විසින් 2006.10.17 වැනි දින පෙ.ව. 10.30 වන තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින්ම ලබාගත හැකි ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර

අ. ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් පහත සඳහන් උපලේඛනයෙහි සඳහන් කර ඇති අන්දමට නිසි ටෙන්ඩර් ඇප මුදලක් තැන්පත් කර ඒ සඳහා ලබාගත් කුවිතාන්සිය සහ

ආ. ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපල පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගත් වත්කම් සහතිකයක් ඉදිරිපත් කල යුතුය.

03. ටෙන්ඩර් සහ වත්කම් සහතිකය ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් යථෝක්ත විදේශ මත්පැන් තැබෑරුම රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ අඩංගු ව ඇති නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර් ඉදිරිපත් කරන්නන් වෙත තරයේ නිවේදනය කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේදී ටෙන්ඩර්කරුවන් පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් සැලකිලිමත් විය යුතුය. :

i. ටෙන්ඩර්පත්‍රය මුළුමනින්ම සම්පූර්ණ කළ යුතුය. එසේ කිරීමේදී එහි සඳහන් කර ඇති මුදල ඉලක්කමෙන් පමණක් නොව අකුරින් ද ලිවිය යුතුය.
ii. සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් ආකෘතිපත්‍රයේ සාක්ෂිකරුගේ අත්සන යොදා තිබිය යුතුය.
iii. සෑම වෙනස්කිරීමක් හෝ වචන කපා හැරීමක් ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන හා දිනය යොදා සහතික කර තිබිය යුතුය.

මෙකී අවශ්‍යතාවයන්ට පටහැනිව ඉදිරිපත් කරන ටෙන්ඩර්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. විධිමත් ලෙස ඉදිරිපත් කරන ලද ටෙන්ඩර්පත්‍රය -
(අ) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මුදල් ගෙවූ කුවිතාන්සිය,
(ආ) වත්කම් සහතිකය,

සමග ලියුම්කවරයක බහා සීල් තබා ලියුම් කවරයෙහි වම් කෙළවරෙහි ඉහළින් "තැබෑරුම් අංක සහ නම" සඳහන් කර දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාර ගැනීම අවසන් වන වේලාවට ප්‍රථම තැන්පත් කළ යුතුය. එසේ නැතහොත් ටෙන්ඩර් භාර ගැනීමේ වේලාව ඉකුත් වීමට ප්‍රථම දෙල්තොට ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

05. රේන්දය වෙනුවෙන් ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන වේලාව ඉහත සඳහන් 1 වන ඡේදයේ සඳහන් කර ඇත. එකී වේලාවන්වල දී සියළුම ටෙන්ඩර්කරුවන් දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතුයි.

06. සාර්ථක ලෙස ටෙන්ඩර් ඉදිරිපත් කළ අය "වරප්‍රසාද මිලදී ගත් තැනැත්තා" වශයෙන් ප්‍රකාශ කරනු ලැබූ පසු ප.ව. 2.30 ට පෙර දෙල්තොට ප්‍රාදේශීය ලේකම් තැන විසින් නියම කරනු ලැබූ මුදලක් ඇප මුදලක් වශයෙන් දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කර යට කී විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවට අත්සන තැබිය යුතුය. මෙම ගෙවීම් මුදලින් හෝ බැංකුවක් විසින් "ගෙවීම් සඳහා" යයි ලකුණු කළ චෙක්පතකින් හෝ ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවකින් හෝ "ආරක්ෂිත චෙක්පතත්" නමැති ස්වරූපයෙන් නිකුත් කරන ලද චෙක්පතක් හෝ බැංකුවකින් ඒ බැංකුවේ නමට නිකුත් කරන ලද චෙක්පතකින් හෝ ගෙවිය යුතුය.

07. සියළුම මත්පැන් තැබෑරුම්වල හෝ වෙනත් බලපත්‍ර ලත් ස්ථානවල විකිණීම සඳහා තොග (පීප්ප) අරක්කු නිකුත් නොකරන ලද බව සැලකිය යුතුය.

08. ආරක්ෂිත හේතුවක් මත හෝ රජය මගින් නිකුත් කරනු ලබන හෝ වෙනයම් කරුණක් මත හෝ විදේශ මත්පැන් තැබෑරුම් තාවකාලිකව වසා තැබීමට නියෝගයක් නිකුත් කිරීමට මා හට සිදුවුවහොත් එම වසා තබන කාලය තුළදී රේන්ද වාරික සහන සැලසීමක් කරනු නොලැබේ.

09. පූර්වෝක්ත දිනයේ දී විකිණීමට නොහැකි වූ තැබෑරුම් රේන්ද නැවත විකිණීම 2006 නොවැම්බර් මස 16 වන දින පෙ.ව. 10.30 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුය.

10. මීට පෙර විදේශ මත්පැන් සැලක් පවත්වාගෙන යෑම සම්බන්ධව රජයට යම්කිසි මුදලක් ගෙවීමට තිබේ නම් ටෙන්ඩරය පිළිගැනීමට ප්‍රථම එම හිඟ මුදල ගෙවා නිම කළ යුතුය.

11. වැඩි විස්තර මෙම කාර්යාලයෙන් විමසා දැන ගත හැකිය.

ටී. ගාමිණී මුණසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
දෙල්තොට.

2006 අගෝස්තු මස 25 වැනි දින,
දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී ය.

*උපලේඛනය*

***මහනුවර දිස්ත්‍රික්කයේ දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අනුමත කළ විදේශ මත්පැන් තැබෑරුම් ලැයිස්තුව-2007 වර්ෂය***

| *අනුක්‍රමික අංකය හා නම* | *කොට්ඨාසය* | *තැබෑරුම පිහිටවිය යුතු ප්‍රදේශය* | *තැබෑරුම විවෘත කර තබන කාලය සහ වේලාව* | *ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන දිනය හා වේලාව* |
| --- | --- | --- | --- | --- |
| අංක 03- පට්ටියගම විදේශ මත්පැන්හල | දෙල්තොට | දෙල්තොට, කරගස්කඩ උතුර ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ | පෙ. ව. 11.00 සිට ප. ව. 200 දක්වා සහ ප.ව. 5.00 සිට ප.ව. 8.00 දක්වා | 2006.10.17 වැනි දින පෙ.ව. 10.30 දක්වා |

අංක 03 පට්ටියගම විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද සඳහා තැන්පත් කළ යුතු තැන්පත් මුදල රු. 1,000 ක් වේ.

09-574

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## සීමාසහිත සම්පත් බැංකුව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ කෙරෙන විකිණීම පිළිබඳ දැන්වීම

ගිණුම් අංකය : 000110042647-දොරලහේන වී ෆැක්ටරි.

සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ, 1999 දෙසැම්බර් 30 වැනි දින සම්මත කරගන්නා ලදුව, 2000 පෙබරවාරි 03 වැනි දින දරන *ගැසට් පත්‍රයේ* සහ 2000 අප්‍රේල් මස 28 වැනි දින "දිවයින" , "අයිලන්ඩ්" සහ "තිනකරන්" යන දිනපතා පුවත්පත්වල ද පළ කරන ලද යෝජනා සම්මතය ප්‍රකාර රුපියල් විසිලක්ෂ හැත්තෑ එක්දහස් හයසිය පනස් නවයකුත් ශත අසූ එකක් (රු. 20,71,659.81) පමණක් වූ මුදල සහ 1999.11.01 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රුපියල් පන්ලක්ෂ දසදහසක් (රු. 5,10,000) සඳහා වර්ෂයකට 11% බැගින් රුපියල් අටලක්ෂ හැටහයදහස් හයසියයක් (රු. 8,66,600) සඳහා වර්ෂයකට සියයට 19.5% බැගින් සහ රුපියල් තුන්ලක්ෂ විසිඑක්දහස් නවසියයක් (රු. 3,21,900) සඳහා වර්ෂයකට සියයට 19.5% බැගින් පොලිය ද, ප්‍රචාරක ගාස්තු හා වෙනත් ගාස්තු ද යන මුදල් ප්‍රමාණ ඉන්පසුව යම් මුදලක් ගෙවා ඇත්නම් ඒ මුදල අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ විස්තර කොට තිබෙන දේපළ කොළඹ බලයලත් වෙන්දේසිකාර ශොක්මන් සහ සමරවික්‍රම මහතුන් විසින් 2006 ඔක්තෝබර් මස 18 වැනි දින පෙ. ව. 11.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, කඩවත් සතර ඇතුළත අක්මීමන, තල්ගස්යායේ පිහිටි බඩහැලයාමුල්ලේ කන්ද නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එස්. ධර්මවර්ධන විසින් මැන සාදන ලද අංක 1161 හා 1980.12.04 දින දරන පිඹුරේ "ඒ " යනුවෙන් සළකුණු කළ බිම් කට්ටිය වන උතුරු-නැගෙනහිරට : දොරලහේන කන්ද ද, දකුණු-නැගෙනහිරට : බඩහැලයාමුල්ලේ කන්ද *නොහොත්* ඇටඹගහකන්ද ද, දකුණු-බස්නාහිරට : මෙම ඉඩමේ ලොට් බී සහ සී දරන කට්ටි ද ; උතුරු බස්නාහිරට : දොරලහේන සහ පාර ද යන මායිම් ඇතුළත රූඩ් තුනකුත්, පර්චස් තිස්නවයක් (අ. 0, රූ. 3, පර්. 39) විශාලත්වය ඇති සහ ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී. 141/72 යටතේ ලියාපදිංචි වී තිබෙන ඉඩම සහ එහි සවිකර තිබෙන හා මතුවට සවිකරනු ලබන යන්ත්‍රසූත්‍ර ද වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
සමාගමේ ලේකම්.

09-640/1

---

## සීමාසහිත සම්පත් බැංකුව

1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවි ධාන) පනතේ 09 වන වගන්තිය යටතේ විකුණුම් නිවේදනය

නම : බී. එම්. ඩබ්ලිව්. පී. බාලසූරිය
ගිණුම් අංකය : 0023 5001 3825.

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2005 ඔක්තෝබර් 14 වැනි දින යෝජනා කොට සම්මත කරගනු ලැබ 2005.12.09 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* ද, 2005.11.28 වැනි දින "දිවයින", "අයිලන්ඩ්" සහ "තිනකුරල්" යන දිනපතා පුවත්පත්වල ද පළ කරන ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් දහතුන් ලක්ෂ අසූතුන් දහස් පන්සිය දහයයි ශත හතරක (රු. 13,83,510.04) මුදල ද, තවත් රුපියල් එකළොස් ලක්ෂ තිස්හතර දහස් පන්සිය පහළොවයි ශත හතළිස් නවයක (රු. 11,34,515.49) මුදල සඳහා වසරකට සියයට විසිතුන (23%) බැගින් 2004 ජනවාරි 01 වැනිදා සිට වෙන්දේසි දින තෙක් තවදුරටත් පොළී මුදල ද සමග ප්‍රචාරක වියදම් හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවා ද සමග එතෙක් ගෙවා ඇති යම් මුදලක් (වේනම්) අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ වඩාත් මැනවින් විස්තර කොට ඇති දේපළ හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ඩන්ස්ටන් කෙලාට් විසින් 2006.10.10 දින පෙ. ව. 11.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය ඇතුළත කටුගම්පොළ හත්පත්තුවේ, කටුගම්පලේ කෝරළේ දකුණ පලුගමුව ග්‍රාමයේ පිහිටි අගරේවත්ත එස්ටේට් නමින් හැඳින්වෙන ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එම්. ජී. එස්. සමරතුංග විසින් මැන සාදන ලද 1998 මැයි 08 දාතම හා අංක 4589 A දරන පිඹුරේ නිරූපිත ලොට් 16 වශයෙන් ලකුණු කොට දක්වා ඇති උතුරට : ඉහත කී අංක 4985 A පිඹුරේ ලොට් 06 ද, නැගෙනහිරට : ඉහත කී අංක 4985 A පිඹුරේ ලොට් 17 ද, දකුණට : මාදම්පේ සිට උඩුබද්දාව දක්වා දිවෙන මහා මාර්ගය ද, බටහිරට : ඉහත කී 4985 A ලොට් 15 ද මායිම් වන කුලියාපිටිය ඉඩම් කාර්යාලයේ R 173/39 වෙළුම/පත්ඉරුව ලියාපදිංචි කොට ඇති එකී අංක 4589 A පිඹුරට අනුව ප්‍රමාණයෙන් පර්චස් පහළොවක් (අක්. 0, රූඩ් 0, පර්. 15) වන බෙදා වෙන්කොට සීමා නිර්නය කළ එකී ලොට් 16 බිම් කොටස එහි පිහිටි සහ එයට අදාළ පස ගහකොළ, වගාවන් සහ එහි පිහිටි හා එයට අදාළ සෑම සියලු දේ සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
සමාගමේ ලේකම්.

09-640/2

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 6/38826/එච්6/039.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබුවා වූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2005.08.05 *ගැසට් පත්‍රයේ* සහ 2005.11.01 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය පානදුර, ඩයස් ගොඩනැගිල්ලහි බලයලත් වෙන්දේසිකාර එච්. ගිල්ටන් පෙරේරා විසින්

එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.10.07 වෙනි දින පෙරවරු 11.00ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර තොටමුණ උතුර, පයාගල බැද්දේ බේරුවල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ (පයාගල මග්ගොන බැද්ද උප කාර්යාලය) දූවේගොඩ පිහිටි සුදුගහලන්ද නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එච්. ඒ. ඩී. ප්‍රේමරත්න විසින් සැකසුණු 1999 පෙබරවාරි මස 25, 26, 27 සහ මාර්තු මස 5 දිනයන් හා අංක 2526 දරන පිඹුරේ කැබලි අංක 08 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ.0, රූ.0, පර්. 11ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමහ වේ. මෙම ඉඩම කොටස කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක එච් 229/97 යටතේ ලියාපදිංචි කොට ඇත.

තවද, එකී අංක 2526 දරන පිඹුරේ කැබලි අංක ආර් 1, ආර් 2, ආර් 3, ආර් 4, ආර් 5, ආර් 6, ආර් 7, ආර් 8 සහ ආර් 9 දරන බිම් කොටස් මතින් හිමි මාර්ග අයිතිය ද සමහ වේ.

ඩබ්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 සැප්තැම්බර් මස 01 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03.

09-633/1

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 6/39123/එල්6/882.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබුවා වූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2005.09.30 *ගැසට් පත්‍රයේ* සහ 2006.01.09 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, පානදුර, ඩයස් ගොඩනැගිල්ලෙහි බලයලත් වෙන්දේසිකාර එච්. ගිල්ටන් පෙරේරා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.10.07 වෙනි දින පෙරවරු 10.00ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර තොටමුණ උතුර, පයාගල බැද්දේ බේරුවල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ (පයාගල මග්ගොන බැද්ද උප කාර්යාලය) දූවේගොඩ පිහිටි සුදුගහලන්ද නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එච්. ඒ. ඩී. ප්‍රේමරත්න විසින් සැකසුණු 1999 පෙබරවාරි මස 25, 26, 27 සහ මාර්තු මස 5 දිනයන් හා අංක 2526 දරන පිඹුරේ කැබලි අංක 31 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ.0, රූ.0, පර්. 10ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමහ වේ. මෙම ඉඩම කොටස කළුතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක එච් 228/81 යටතේ ලියාපදිංචි කොට ඇත.

තවද, එකී අංක 2526 දරන පිඹුරේ කැබලි අංක ආර් 1, ආර් 2, ආර් 3, ආර් 4, ආර් 5, ආර් 6, ආර් 7, ආර් 8 සහ ආර් 9 දරන බිම් කොටස් මතින් හිමි මාර්ග අයිතිය ද සමහ වේ.

ඩබ්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන සාමාන්‍යාධිකාරී.*

2006 සැප්තැම්බර් මස 01 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03,

09-633/2

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංක : 6/41054/එච්6/012-6/43027/එච්6/461.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබුවා වූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2003.07.25 *ගැසට් පත්‍රයේ* සහ 2003.11.01 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය, පානදුර, ඩයස් ගොඩනැගිල්ලෙහි බලයලත් වෙන්දේසිකාර එච්. ගිල්ටන් පෙරේරා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2006.10.07 වෙනි දින පස්වරු 3.00ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ, බැල්ලපිටිය සහ මුණගම ග්‍රාමයන්හි පිහිටි සොරණ රාජ්‍ය වතුයායේ දික්හේන කොටසේ කලින් යහල කැලේ ගෘප් නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඩී. එච්. ඇතුලත්මුදලි විසින් සැකසුණු 1988.10.01 දින හා අංක 2058 දරන පිඹුරේ කැබලි අංක 133 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ.0, රූ. 0, පර්. 25ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමහ වේ. මෙම ඉඩම් කොටස පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඩී 1231/169 යටතේ ලියාපදිංචි කොට ඇත.

ඉහත කී අංක 2058 දරන පිඹුරේ කැබලි අංක 423 (අඩි 45 ක් පළල පාරක් සඳහා වෙන් කරන ලද ) කැබලි අංක 428 (අඩි 20ක් පළල පාරක් සඳහා වෙන් කරන ලද ) සහ අංක 1376 දරන පිඹුරේ කැබලි අංක 255

(අඩි 40ක් පළල පාරක් සඳහා වෙන් කරන ලද ) දරන බිම් කොටස් මතින් වූ මාර්ග අයිතිය ද සමඟ වේ.

ඩබ්. ඩී. මෙන්ඩිස්,
*වැඩබලන* සාමාන්‍යාධිකාරී.

2006 සැප්තැම්බර් මස 01 වැනි දින,
අංක 269, ගාලු පාර,
කොළඹ 03,

09-633/3.

---

## ජාතික ඉතිරිකිරීමේ බැංකුව

### සංශෝධිත පරිදි වූ 1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ ( විශේෂ විධිවිධාන ) පනතේ 13 වන වගන්තිය යටතේ විකිණීම

ජාතික ඉතිරිකිරීමේ බැංකුව සතු අගනා දේපළක් වෙන්දේසියේ විකිණීම.– බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළේ, මැද පත්තුවේ, ගම්පහ ප්‍රාදේශීය සභා සීමාවේ පිහිටි පරකන්දෙනිය ග්‍රාමයේ "පරකන්දෙනිය එස්ටේට්" නමැති ඉඩමේ ලොට් අංක 60 ලෙස ලකුණු කළ පර්චස් 12.81 ක් විශාලත්වය ඇති අගනා බිම් කට්ටිය වෙන්දේසියේ විකිණීම.

*දේපළ විස්තරය.–* ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, මැද පත්තුවේ, පරකන්දෙනිය ග්‍රාමයේ පිහිටි, පරකන්දෙනිය එස්ටේට් නමැති තනි දේපළක් සංයුක්ත වන ගොරකගහලන්ද, වෙරළුගහලන්ද, දෙල්ගහවත්ත *නොහොත්* කෝන්ගහවත්ත සහ මිල්ලගහවත්ත නමැති ඉඩම්වලට, බලයලත් මිනින්දෝරු කේ. ඩී. ජී. වීරසිංහ විසින් මැන සාදන ලද අංක 1060 හා 1996 ජූලි මස 15 දින දරන පිඹුරේ ලොට් අංක 60 ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටියට මායිම්, උතුරට : ලොට් අංක 140 ද, නැගෙනහිරට : ලොට් අංක 61 ද දකුණට : පරකන්දෙනියවත්ත (කොටසක්) ලොට් "බී" දරන කට්ටිය ද, බස්නාහිරට : ලොට් අංක 59 ද යන මායිම් ඇතුළත පර්චස් දොළහකුත් දශම අටයි එකක් (අ. 0, රූ. 0, පර්. 12.81) *නොහොත්* (හෙක්ටයාර් 0.0324) විශාලත්වය ඇති බිම් කට්ටිය.

මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම /පත්ඉරු E 562/153 යටතේ ලියාපදිංචි වී ඇත.

ඉහත කී අංක 1060 දරන පිඹුරේ ලොට් අංක 140 මතින් මාර්ග අයිතිය ද, වේ. එකී ලොට් අංක 60 සහ 140 දරන බිම් කට්ටි මෙහි පහත විස්තර කරන ඉඩමෙන් බෙදා වෙන්කළ කොටස් ය.

මෙම දේපළ ජාතික ඉතිරිකිරීමේ බැංකුවට උකස් කර ඇත්තේ, කැළණිය, පොල්හේන, මූනමල්ගහ වත්ත පාරේ, අංක 354හි පදිංචි එච්. ඒ. එස්. පී. නීල් මහතා විසිනි.

*දේපළට ළඟාවීම.–* කොළඹ -නුවර පාරේ, ඉඹුල්ගොඩ කොකිස් කඩේ හන්දියෙන් වමට ඇති ගනේමුල්ල පාරේ කිලෝමීටර් 2 ක් පමණ ගොස් වම් පසට ඇති පාරේ මීටර් 225 ක් පමණ ඉදිරියට ගියවිට "නැදුන් උයන" නමැති වෙන්දේසි ඉඩමේ ලොට් අංක 60 දරන බිම් කට්ටිය.

මෙම දේපළ අප විසින් 2006 ඔක්තෝබර් මස 05 වෙනි බ්‍රහස්පතින්දා දින පෙ. ව. 11.00 ට දේපළ පිහිටි ස්ථානයේ දී, ඊට අයත් සියළු දේ සමඟ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.–* සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය නිම වූ වහාම පහත සඳහන් මුදල් ප්‍රමාණයන් ගෙවිය යුතුය :

1. ගැණුම් මිලෙන් 25%,
2. ගැණුම් මිලෙන් 1% ක් ප්‍රාදේශීය සභා අයබදු ලෙස ගෙවිය යුතු ය,
3. ගැණුම් මිලෙන් 2 1/2%ක් වෙන්දේසිකරුගේ කොමිස් මුදල ලෙස ගෙවිය යුතුය,
4. රු. 54,000ක් වන ප්‍රචාරක වියදම,
5. ලිපිකරුගේ හා සෝෂකකරුගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තුව වශයෙන් රු. 3,000ක් ගෙවිය යුතු ය.

ගැණුම් මිලෙන් ඉතිරි වූ 75% මුදල, වෙන්දේසි දින සිට දින 30ක් තුළ බැංකුව වෙත ගෙවිය යුතුය.

*වැඩිදුර විස්තර සහ විකුණුම් කොන්දේසි සඳහා.* :

සහකාර සාමාන්‍යාධිකාරී (ණය ),
ජාතික ඉතිරිකිරීමේ බැංකුව,
අංක 255, ගාළු පාර,
කොළඹ 3.
දුරකථන අංකය : අංක 2576132.

ෂොක්මන් සහ සමරවික්‍රම,
ශ්‍රී ලංකාවේ බැංකු සඳහා පිළිගත් පුරෝගාමී
වරලත් වෙන්දේසිකරුවෝ සහ තක්සේරුකරුවෝ.

| | |
|---|---|
| *අගනුවර කාර්යාලය :* | *ප්‍රධාන කාර්යාලය :* |
| 55ඒ, ධර්මපාල මාවත. | 24, ටොරින්ටන් පාර, |
| කොළඹ 03. | මහනුවර. |
| දුරකථන අංක : | දුරකථන අංක : |
| 01-2448526. | 081-2224371. |
| 01-2441761 | 081-2227593 |
| ෆැක්ස් : 01-2448526. | ෆැක්ස් : 081-2224371. |
| ඊමේල් : සමර@ ශ්‍රී ලංකා. නෙට් | ඊමේල් : සමර @ ඩයමන්ඩ්. ලංකා නෙට්. |

09–595

---

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව - බියගම ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු විසින් ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වගන්තිය යටතේ විකිණීම

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළයේ, අධිකාරිපත්තුවේ බියගම පිහිටි මාරගහවත්ත (කොටස) නමැති ඉඩමට බලයලත් මානක ජේ. පී. අයි. අබේකෝන් විසින් සාදනු ලැබූ අංක 1079 සහ 1994.04.04 දිනැති පිඹුරෙහි ලොට් බී වශයෙන් සලකුණු කළ බෙදා වෙන් කළ බිම් කොටස පිඹුරු අංක 1079 හි පෙන්වා ඇති මාර්ගයන් භාවිතා කිරීමේ අයිතිය සමඟ වේ. ප්‍රමාණය අ. 0, රූ, 0, පර්. 35 සීමාසහිත හැටන් නැෂනල් බැංකුව මා වෙත පවරා දී ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියළු ස්ථාපිත ගෙවීම් හා

වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියළු මුදල් අයකර ගැනීම පිණිස ඉහත සඳහන් දේපළ 2006.10.02 දින පෙ. ව. 11.00 ට ඇරඹෙන පරිදි එකී ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. ඩබ්ලිව්. රාජකරුණා විසින් සහතික කරන ලද්දා වූ ද, සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දා වූ ද, 1998.08.31 දින සහ අංක 16477 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම හබරාගමුවගේ සුරාජ් චමින්ද හබරාගමුව සහ අධිකාරිආරච්චිගේ ප්‍රේමාවතී ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්.

*දේපළට පිවිසිය හැකි මාර්ගය.* – කඩුවෙල සිට දෙළිගොඩ පාරේ සැතපුම් 3 4 ගියවිට වම් අත පැත්තේ කොටුන්න පාරේ තවත් සැතපුම් 1 4 ගියවිට දකුණුපස ඇති සමගි මාවතේ යාර 200 පමණ ගියවිට විකිණීමට ඇති අදාළ ඉඩම හමුවේ මෙම ඉඩම පාරට මුහුණ දී ඇත.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2005.05.20 වැනි දින දරන *ගැසට් පත්‍රය* සහ 2005.06.14 වැනි දින අයිලන්ඩ්, දිවයින හා තිනකරන් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*–වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවලේම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය :

1. ගැණුම් මිලෙන් 10%ක් ද,
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් 2 1/2% ද,
4. විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද,
5. විකුණුම් කොන්දේසි පිළියෙල කිරීම හා සහතික කිරීම වෙනුවෙන් නොතාරිස් ගාස්තුව රු. 2,000 ද වේ.

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30 ක් ඇතුළත ගැණුම් මිලේ පරිශේෂය වන 90 ක මුදල ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණය අධීක්ෂණ හා අයකර ගැනීම) සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10. වෙත ලබාදිය යුතුය.

දුරකථන අංක : 2661815,
2661817.

අදාළ ඔප්පු හා අනෙකුත් ලියවිලි පරික්ෂා කිරීම හා වෙනත් අදාළ තොරතුරු ප්‍රධාන කළමණාකරු නීති (අයකර ගැනීම), සීමාසහිත හැටන් නැෂනල් බැංකුව, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10. දුරකථන අංකය : 2661817.

රංජිත් එස්. මහානාම,
සාම විනිසුරු (මුළු දිවයිනටම),
උසාවි කොමසාරිස්,
තක්සේරුකරු හා බලයලත් වෙන්දේසිකරු.

ආර්. එස්. එම්. ඔක්ෂන්ස්,
මහානාම ඩ්‍රයිව්,
අංක 474, පිටකෝට්ටේ,
කෝට්ටේ.
දුරකථන අංකය : 2863121.

09-622

## සීමාසහිත පෑන් ඒෂියා බැන්කින් කෝපරේෂන් - පිටකොටුව ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු විසින් ප්‍රදානය කරනලද ණය අයකර ගැනීමේ(විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන වෙන්දේසිය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභාව ඇතුළත මට්ටක්කුලියේ පිහිටි මිනුම්පති විසින් සහතික කරන ලද අංක සීබී 5567 දරන මූලික පිඹුරේ නිරූපිත දැනට හාබර් විව් පාක් නමින් හැඳින්වෙන (කාක දූපත) ක්‍රෝ අයිලන්ඩ් නමැති ඉඩමට (බලයලත් මිනින්දෝරු සී. ද එස්. ගුණතිලක විසින් සාදන ලද 1988. 04.11 දාතම හා අංක 1474 දරන පිඹුරේ බලයලත් මිනින්දෝරු සී. ද එස් ගුණතිලක විසින් සාදන ලද 1988.01.26 දාතම හා අංක 1429 දරන පිඹුරේ නිරූපිත ලොට් 2 හි උපබෙදුමක් වන) ලොට් 23 වශයෙන් ලකුණු කොට දක්වා ඇති විස්ට්වයික් පාරේ වරිපනම් අංක 65/396 දරන පර්චස් 6ක් *හෙවත්* හෙක්ටයාර් 0.0152 විශාලැති ඉඩමේ පිහිටි ගොඩනැගිල්ල සමග ඉහත කී අංක 1474 දරන පිඹුරේ නිරූපිත ලොට් 71 සහ 74 දරන ඉඩම් මතින් ඇති මාර්ග අයිතිය.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. අයි. සමරසිංහ විසින් සහතික කරන ලද්දාවූ ද පෑන් ඒෂියා බැන්කින් කෝපරේෂන් ලිමිටඩ් නමට ලියන ලද්දා වූ ද, 1999.01.06 දාතම හා අංක 686 සහ 1999.07.23 දාතම අංක 751 දරන බැඳුම්කරය යටතේ අය විය යුතු මුදල් ගෙවීම කොළඹ 11, කෙයිසර් වීදියේ අංක 128 1/1, 19වී 20යූ, දරන ස්ථානයේ සිය මූලික ව්‍යාපාර ස්ථානය පවත්වාගෙන යන රාජා ට්‍රේඩ් සෙන්ටර් යන ව්‍යවහාරික ව්‍යාපාර නාමය යටතේ හවුල් ව්‍යාපාරික කටයුතු කරගෙන යන දෙහිවල අනගාරික ධර්මපාල මාවතේ අංක 21/2 දරන ස්ථානයේ (දෙදෙනාම) පදිංචි සිතම්පරම් නඩරාජා සහ කාංචනදේවි නඩරාජා යන අය බැඳුම්කරුවන් වශයෙන් හා දෙහිවල අනගාරික ධර්මපාල මාවතේ අංක 21/2 දරන ස්ථානයේ පදිංචි සීතම්පරම් නඩරාජා උකස්කරු වශයෙන් ඉහත සඳහන් බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති බැවින් එකී බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් අයකර ගැනීම පිණිස පෑන් ඒසියා බැන්කින් කෝපරේෂන් ලිමිටඩ් විසින් මා වෙත පවරන ලද බලය මත ඉහත සඳහන් කළ දේපළ මා විසින් 2006 ඔක්තෝබර් මස 5 වන දින පෙරවරු 10.30 කණිසමට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා 2004.06.11 ශ්‍රී *ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයද*, 2004.05.28 වන දින ඩේලි නිවුස්, දිනමිණ සහ තිනකරන් යන පුවත් පත් බලන්න.

*දේපළට ප්‍රවේශ වන මාර්ගය.*– කොටුවේ සිට මට්ටක්කුලිය දෙසට කි. මී. 4 ක් පමණ ගොස් රාසමුනකන්ද මංසන්දියෙන් වමට ඇති තාර පාරේ මීටර් 30 ක් පමණ ගොස් නැවතත් දකුණට ඇති විස්ට්වයික් පාරේ තවත් මීටර් කිහිපයක් ගිය පසුව මෙම දේපළ හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය අවසන් වූ විගස සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවේලේම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුය. : 1) ගැනුම් මිලෙන් 10% ක්ද, 2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ක් ද, 3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් වශයෙන් 2 1/2% ක් ද, 4) රු. 54,000 කට නොවැඩි වෙන්දේසි වියදම් වලින් 50% ක් ද 5) ලිපිකරු හා සෝෂක ගාස්තු වශයෙන් රු 500 ක් ද, 6) නොතාරිස් ගාස්තු වශයෙන් රු. 2,000 ක් ද

වේ. ගැණුම් මිලේ ඉතිරි 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් ලිමිටඩ් තැන්පත් කළ යුතුය.

හිමිකම් ඔප්පු සහ වැඩිදුර විස්තර සඳහා විමසන්න. - කොළඹ 03. ගාලු පාරේ අංක 450 පිහිටි පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් ලිමිටඩ්හි කළමනාකාරිනී නීතිගෙන් විමසන්න. දුරකථන අංක : 565573, 565565, 565570-71.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු
හා බලයලත් වෙන්දේසිකරු.

134, බැද්දගාන පාර,
කෝට්ටේ,
දුරකථන අංක : 2873656, ෆැක්ස් 2871184, ජංගම දු.ක. : 0777-672082.

09-587

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් - මහරගම ශාඛාව

1990 අංක 4 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බලයලත් මානක මර්වින් සමරනායක විසින් 1988 මාර්තු මස 08 වනදින සාදන ලද අංක 2198 දරන පිඹුර පරිදි බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ පල්ලේපත්තු සල්පිටි කෝරළේ ඇරැව්වල පිහිටි මොරගහවත්ත ඉඩමේ ගහකොළ, වගාවන් සහ ගොඩනැගිලි සමග බෙදා වෙන් කරන ලද ලොට් 17 දරන පර්චස් විස්සයි දශම තුනක් (අ. 0 රූ. 0 පර්. 20.3) විශාල ඉඩම වේ.

ඉප්නා ජෙම්ස් ඇන්ඩ් ජුවෙලර්ස් යන නාමය අභිධානය සහ ආයතන යටතේ හවුල් වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යන රොහාන් වක්වැල්ල *හෙවත්* නම්බුකාර වක්වැල්ලගේ රොහාන් චන්ද්‍රසිරි සහ ඇන් ලක්මාලි ගජසිංහ ණයකරුවන් හැටියට ද, සහ ඇන් ලක්මාලි ගජසිංහ උකස්කාරිය හැටියට ද, කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්ට උකස් කරන ලද ඉහත සඳහන් කළ දේපළ, වර්ෂ 2006ක් වූ ඔක්තෝබර් මස 10 දින පෙ. ව. 11.30 ට එම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2006.05.19 දින රජයේ *ගැසට් පත්‍රය* ද, ලංකාදීප, අයිලන්ඩ් සහ තිනකරන් පත්‍රද, විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2006.09.15 දින රජයේ *ගැසට් පත්‍රය* ද, 2006.09.18 දින ලංකාදීප සහ අයිලන්ඩ් පත්‍ර ද බලන්න.

*ඉඩමට පිවිසීම.*– පන්නිපිටිය මොරකැටිය හංදියේ සිට ඇරැව්වල පාර ඔස්සේ කිලෝමීටරයක් පමණ (කොස්හේන හංදිය පසුකර මීටර් 75ක් පමණ) ගොස් "ප්ලාන්ට් නර්සරි" නමින් දැක්වෙන නාම පුවරුව ළඟින් වමට හැරී ප්‍රාදේශීය සභා තාර පාර ඔස්සේ මීටර් 150ක් පමණ ගියවිට අදාළ දේපළ පාරේ දකුණු පසින් පිහිටා ඇත.

*ගෙවීම් ක්‍රමය.*– විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදල් ගෙවිය යුතුයි. :

(1) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
(2) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%),
(3) වෙන්දේසිකරුගේ කොමිස් ගැණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
(4) නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සකස් කිරීම සඳහා රු. 2,000,
(5) ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500,
(6) සියළුම ප්‍රචාරක වියදම් ද,
(7) ගැණුම් මිලෙන් ඉතිරි (90%) විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි ප්‍රධාන කාර්යාලයේ හෝ මහරගම ශාඛාවේ තැන්පත් කළ යුතුයි.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා විමසන්න :

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු සහ උසාවි කොමසාරිස්,
කොළඹ වානිජ මහාධිකරණය සහ දිසා අධිකරණය,
රාජ්‍ය සහ වාණිජ බැංකු.
අංක 99, උසාවිය පාර, කොළඹ 12.
දුරකථන/ෆැක්ස් අංකය : 2445393.

කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමටඩ්.

අංක 154, හයිලෙවල් පාර,
මහරගම.
දුරකථන : 2850505, 2844915, 2844914,
ෆැක්ස් අංකය : 2851232.

09-630

---

## නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් ලිමිටඩ් - මූලස්ථාන ශාඛාව

1990 අංක 4 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන වෙන්දේසියයි

**හොරණ ආයෝජන ප්‍රවර්ධන කලාපයේ පිහිටි තඹ නිෂ්පාදනය කරන කර්මාන්ත ශාලාවක් අයිති වටිනා යන්ත්‍රෝපකරණ සහ මෙවලම් විකිණීම**

විවිධ වර්ගයේ පරීයේෂණ උපකරණ සහ ඒවා ගබඩා කර ඇති අසුරන සහ මෙවලම්, SMT ධාරිතාව සහිත EOT ක්රේන් 02යි, මොබයිල් ක්‍රේන් 1යි, ටූල්ස් ඇන්ඩ් ටැකල්ස්, ස්පෙයාර්ස් ඇන්ඩ් රෝල්ස් සහ රේල්ස් ගයිඩ්ස්.

ඉහත සඳහන් කළ චංචල දේපළ බස්නාහිර පළාතේ. කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළේ උඩුගහ පත්තුවේ හොරණ දිසා ලේකම් කාර්යාල සීමාව තුළ පෝරුවදණ්ඩ ගමෙහි පිහිටි පර්ත් එස්ටේට් හි මාපුටිගල සහ කුවින්ස්බේ කොට්ඨාසය නමින් හඳුන්වන ඉඩමෙහි බලයලත් මිනින්දෝරු ආර්. අලහකෝන් විසින් මැන සාදන ලද 2001.01.31 දින අංක 1110 දරන පිඹුරේ ලොට් 14 දරන පරිශ්‍රය තුළ පහත සඳහන් ස්ථානයේ තබා හෝ ගබඩා කර ඇත.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඒ. කපුවත්ත (මිය) විසින් සහතික කරන ලද්දාවූ ද 2002.05.16 දින අංක 449 දරන උකස්කරය යටතේ නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා සහ දැනට නැෂනල් ඩිවෙලොප්මන්ට්

බැන්ක් ලිමිටඩ් විසින් සපයන ලද ණය පහසුකම් කොළඹ 03 ගාලු පාරේ අංක 546 සහ දැනට හොරණ, ආයෝජන ප්‍රවර්ධන කලාපයේ අංක 14 දරන ස්ථානයේ සිය ලියාපදිංචි කාර්යාලය පිහිටි කලම්බෝ කොපර් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් පැහැර ඇති බැවින් නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් ලිමිටඩ් විසින් මා වෙත පවරන ලද බලය මත ඉහත සඳහන් කළ දේපළ වර්ෂ 2006 ඔක්තෝබර් මස 04 වන දින පෙරවරු 11.00ට දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩිදුර විස්තර සඳහා 2006 සැප්තැම්බර් මස 08 වන දින ශ්‍රී ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රය* ද, 2006 අගෝස්තු මස 26 වැනි දින දිවයින ද, අයිලන්ඩ් සහ තිනකරන් යන පුවත් පත් ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය.–* වෙන්දේසිය අවසන් වූ විගස ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවේලේ ම වෙන්දේසිකරු වෙත ගෙවා සිටිය යුතුය. (1) සම්පූර්ණ ගැණුම් මුදලට, (2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද, (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2%ක් ද, (4) රු. 55,000 නොවැඩි වෙන්දේසි වියදම් වලින් 50%ක්ද, (5) ලිපිකරු හා ගෝෂක ගාස්තු වශයෙන් රු. 500 ක්ද, (6) වෙන්දේසි කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු වශයෙන් රු. 2,000ක් ද වේ.

හිමිකම් ඔප්පු සහ වැඩිදුර විස්තර සඳහා විමසන්න. කොළඹ 02, නවම් මාවතේ අංක 40, පිහිටි නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් ලිමිටඩ් හි උප සභාපති, නීති දුරකථන අංක 2437701 - 10, හෝ 2448448.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

අංක 134, බැද්දගාන පාර, කෝට්ටේ.
දුරකථන අංක 2873656, ෆැක්ස් අංක 2871184,
ජංගම 0777-672082.

09-585

---

## නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් ලිමිටඩ්-මූලස්ථාන ශාඛාව

1990 අංක 4 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන වෙන්දේසිය

හොරණ, ආයෝජන ප්‍රවර්ධන කලාපයේ පිහිටි වටිනා තඹ නිෂ්පාදන කරන කර්මාන්ත ශාලාවක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරලේ, උඩුගහ පත්තුවේ හොරණ දිසා ලේකම් කාර්යාල සීමාව තුළ පෝරුවදණ්ඩ ගමෙහි පිහිටි පර්ත් එස්ටේට් හි මාපුටිගල සහ ක්වින්ස්බේ කොට්ඨාශය නමින් හඳුන්වන ඉඩමෙහි බලයලත් මිනින්දෝරු ආර්. අලහකෝන් විසින් මැන සාදන ලද 2001.01.31 දින අංක 1110 දරන පිඹුර පරිදි බෙදා වෙන්කළ ලොට් 14 ප්‍රමාණයෙන් අක්කර 05යි රූඩ් 0 පර්චස් 18 විශාල ඉඩම කොටසේ කල්ගත නොවූ බද්ද, අයිතිවාසිකම් හිමිකම් ඒ සමඟ එකී ඉඩම සහ/හෝ ගොඩනැගිලිවලට ස්ථිරව සම්බන්ධ හෝ සවිකර ඇති සහ දැනට හෝ මින්මතුවට එම ඉඩමේ සහ/හෝ ගොඩනැගිලිවලට සම්බන්ධ සෑම සහ සියළු නිශ්චල යන්ත්‍ර සූත්‍ර වැඩිදියුණු කිරීම් සහ සැපයීම් ද ඇතුළුව ඒවාට පමණක් සීමා නොවී පහත දේද ඇතුළත් වේ.

IMT/hr ධාරිතාව සහිත බේලින් ප්‍රෙස් 01යි, සෙට් 2 කින් සමන්විත වූ ෆර්නර්ස්, කම්ප්‍රෙෂර්, බ්ලෝවර්ස්, රිෆැක්ටර්ස්, මෝල්ඩින්, බේස්, ප්ලේට්ස්, වින්චර්ස්, මෙටිරියල් හැන්ඩ්ලින්,පොට් ෆර්නර්ස් සහ ආයුධ සහ ටැකල්ස් ඇතුළු මෙල්ඩින්, රූෆයින්ස් සහ කාෆ්වින් උපකරණ 01යි, ස්ලැග් පල්සර්වේෂන් සඳහා වූ බෝල් මිල් 01යි, ග්‍රයින්ඩර්ස් 02යි, රිහිටින් ෆර්නර්ස් 2යි, රෝලින් මිල් උපකරණ සෙට් 01යි, 2DG සෙට් සහිතව බලය බෙදා හැරීමේ සම්පූර්ණ කි. වෝ. 500 ක් වූ ප්‍රධාන මිල් ඩ්‍රයිව් 02යි, ජලනළ උපකරණ සහිත ජලය සැපයීමේ පද්ධතිය, වායුසමීකරණ උපකරණ ඇතුළුව කම්ප්‍රෙෂරය සහිත වායු සමීකරණ පද්ධතිය, ඛනිජ තෙල් ගබඩා කිරීමේ පද්ධතිය ඇතුළු ටැංකි 02යි, ලුබ්රිකේටිං පද්ධතිය ඇතුළු පයිප් සහ රොල් ලේත් සමග විදුලිය සැපයීමේ පද්ධතිය සහ උපකරණ විදුලි සංදේශ උපකරණ ඇතුළු විදුලි සංදේශ පද්ධතිය ද වේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඒ. කපුවත්ත (මිය) විසින් සහතික කරන ලද්දාවූ ද 2002.05.16 දින අංක 448 දරන උකස්කරය යටතේ නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා සහ දැනට නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් ලිමිටඩ් විසින් සපයන ලද ණය පහසුකම් ගෙවීම කොළඹ 03 ගාලු පාරේ අංක 546 සහ දැනට හොරණ, ආයෝජන ප්‍රවර්ධණ කලාපයේ අංක 14 දරන ස්ථානයේ සිය ලියාපදිංචි කාර්යාලය පිහිටි කලම්බෝ කොපර් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් පැහැර ඇති බැවින් නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් ලිමිටඩ් විසින් මා වෙත පවරන ලද බලය මත ඉහත සඳහන් කළ දේපළවල කල්ගතනොවූ බදු අයිතිය. අයිතිවාසිකම් සහ හිමිකම් වර්ෂ 2006 ඔක්තෝබර් මස 04 වන දින පෙරවරු 10.30 ට දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩිදුර විස්තර සඳහා 2006 සැප්තැම්බර් මස 08 වන දින ශ්‍රී ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රය* ද, 2006 අගෝස්තු මස 26 වැනි දින දිවයින, ද අයිලන්ඩ් සහ තිනකරන් යන පුවත් පත් ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය.–* වෙන්දේසිය අවසන් වූ විගස ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවේලේ ම වෙන්දේසිකරු වෙත ගෙවා සිටිය යුතුය. (1) ගැණුම් මිලෙන් 10%ක් ද, (2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක්ද, (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2%ක් ද, (4) රු. 55,000 ට නොවැඩි වෙන්දේසි වියදම් වලින් 50%ක්ද, (5) ලිපිකරු හා ගෝෂක ගාස්තු වශයෙන් රු. 500 ක්ද, (6) වෙන්දේසි කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු වශයෙන් රු. 2,000ක් ද වේ. ගැණුම් මිලේ ඉතිරි මුදල වන 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත තැන්පත් කළ යුතුය.

හිමිකම් ඔප්පු සහ වැඩිදුර විස්තර සඳහා විමසන්න. කොළඹ 02, නවම් මාවතේ අංක 40, පිහිටි නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් ලිමිටඩ් හි උප සභාපති, නීති දුරකථන අංක 2437701 - 10, හෝ 2448448.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

අංක 134, බැද්දගාන පාර, කෝට්ටේ.
දුරකථන අංක 2873656, ෆැක්ස් අංක 2871184,
ජංගම 0777-672082.

09-584

## ප්‍රසිද්ධ වෙන්දේසියක්

සබරගමු පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොළොන්න කෝරළේ දැයපොතගම පත්තුවේ, ඇඹිලිපිටිය උඩුගම ග්‍රාමයේ පිහිටියාවූද, උතුරින් රජයේ ඉඩමෙන් හා මාදම්පේ සිට නෝනාගම දක්වා වූ ප්‍රධාන පාරෙන් නැගෙනහිරින් ජයවර්ධන හා ටී. පී. හැරී විසින් හිමිකම්පානු ලබන ඉඩමෙන් දකුණින් කාවන්තිස්ස පන්සලට අයත් ඉඩමෙන් හා බස්නාහිරින් චාන්දනී, යූ. එම්. සුනිල්, පී. සෙනෙවිරත්න හා සෞම්‍යලතා විසින් හිමිකම් පානු ඉඩම්වලින් මායිම් වූද, ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් එකයි පර්චස් දහයයි දශම හතක් (අ. 1, රූ. 1, පර්. 10.7) යුක්ත වූද, රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙහි ජී 160/ 94 දරන හිමිකම යටතේ ලියාපදිංචි කර ඇත්තාවූද, ජාසින් ජලත්ගේ ජාගොඩගේ පංගුව යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙන් බලයලත් මිනින්දෝරු කේ. පී. ධර්මරත්න විසින් සාදන ලද අංක 830 හා 1995 ක්වූ අප්‍රේල් මස 25 වැනි දින දරන පිඹුරේ නිරූපිත මුලු ඉඩම් සහ පරිශ්‍රය වේ.

රුපියල් විසිලක්ෂ තුන්දහස් තුන්සිය තිස් අටයි ශත හැත්තෑ එක (රු. 20,03,338.71) ක මුදලක් සහ ඒ මුදල මත වර්ෂ 1999 ක්වූ සැප්තැම්බර් මස 16 දින සිට ඒ මුදල ද සම්පූර්ණයෙන් ගෙවා අවසන් කරන තෙක් වර්ෂයකට සියයට තිහ (30%) ක අනුප්‍රමාණයක් අනුව වූ පොළියක්ද, නඩු ගාස්තු සහ වෙන්දේසිකරුගේ ගාස්තු ද අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ වඩාත් විස්තර කර ඇති දේපළ (1) ඇඹිලිපිටියේ, පල්ලේගම, රූපසිංහ නිවසේ හා ඇඹිලිපිටිය පල්ලේගම, 'අප්සරා එන්ටප්‍රයිස්' හා දැනට ඇඹිලිපිටිය නව නගරයේ දුම්කොළ සමාගම් පාරේ අංක 17 හි පදිංචි සිරිසේන ඒකනායක (2) ඇඹිලිපිටිය, පල්ලේගම, රූපසිංහ නිවසේ වීරසිංහ කම්කානම්ගේ කිරිමැණිකේ යන අයට විරුද්ධව කොළඹ 03, ශාන්ත මයිකල් පාරේ, අංක 28 දරන ස්ථානයේ පිහිටි මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ලිමිටඩ් යන ආයතනය විසින් කොළඹ දිසා අධිකරණයේ අංක 17054/එම්බී දරන නඩුවෙන් මා වෙත පවරන ලද කොමිසම මත පහත සඳහන් උපලේඛනයේ සඳහන් දේපළ වර්ෂ 2006 ක්වූ ඔක්තෝබර් මස 12 වැනි දින පෙරවරු 11.00 ට අදාළ දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.–* වෙන්දේසිය අවසන් වූ විගස ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවේලේම වෙන්දේසිකරු වෙත ගෙවා සිටිය යුතුය. (01) ගැණුම් මිලෙන් 25% ක්ද, (2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ක්ද, (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2% ද, (4) වෙන්දේසි සඳහා දරන්නට වූ වියදම් ද, (5) වෙන්දේසි කොන්දේසි සහතික කිරීමේ ගාස්තු වශයෙන් රු. 2000, (6) ලිපිකරු හා සෝෂක ගාස්තු වශයෙන් රු. 1,000 ක මුදලක්ද වන අතර ගැණුම් මිලේ පරිශේෂය වෙන්දේසි දිනයේ සිට දින 30 ක් ඇතුළත කොළඹ දිසා අධිකරණයේ මෙම නඩුවේ බැරට තැන්පත් කළ යුතුය.

වැඩිදුර විස්තර සහ අදාල ලියවිලි පරීක්ෂා කිරීම සඳහා කොළඹ 03, ශාන්ත මයිකල් පාරේ අංක 28 දරන ස්ථානයේ 14 මහලේ පිහිටි මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ලිමිටඩ් හි කළමනාකාරිනී-නීති නීතිඥ මිහුරුම් ජයසිංහ මහත්මියගෙන් විමසන්න දුරකථන අංක 4711711.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

අංක 134, බැද්දගාන පාර, කෝට්ටේ.
දුරකථන අංක 2873656, ෆැක්ස් 2871184 ජංගම 0777-672082.

09-586
B6 – B 079366

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397) අධිකාරය හා එහි සංශෝධනවල 22 වෙනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

සින්නතෝමලාගේ ඇල්ප්‍රඩ් ප්‍රනාන්දු මහතා සහ ඇනා ප්‍රන්සිස්කා ප්‍රනාන්දු මහත්මිය යන අයගේ ණය වගකීම් සඳහා උකස් කළ ජා-ඇල වැලිගම්පිටිය ශාන්ත ඇන්ස් පාරේ, 1 වෙනි පටුමග, අංක 7 හි පිහිටි දේපළ :

ලංකා බැංකු ආඥා පනතේ 19 වෙනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනජරජයේ 2006.08.04 දිනැති අංක 1457 දරන ගැසට් පත්‍රයේ හා 2006.07.28 දිනැති ඩේලිනිවුස්, දිනමිණ හා තිනකරන්, යන පුවත්පත් වල පළ කරන ලද යෝජනාවකට අනුකූලව එකී ආඥා පනතේ අංක 26 දරන වගන්තිය යටතේ අයකර ගත හැකි මුල් මුදලේ ශේෂයද විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලියි ද, ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයෙහි විස්තර කොට ඇති දේපල හා පරිශ්‍ර පිහිටි ස්ථානයේදීම 2002.09.30 වෙනි දින පෙ. ව. 11.00ට කෝට්ටේ, පිටකෝට්ටේ, අංක 474 හි පදිංචි ආර්. එස්. එම්. වෙන්දේසිකාර මහතුන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, රාගම්පත්තුවේ, ජා-ඇල නගර සභා සීමාවේ, වැලිගම්පිටිය හි පිහිටි සාන්ත ඇන්ස් පාරේ, පළවෙනි පටුමග, වරිපනම් අංක 7 දරන මිල්ලගහවත්ත නමැති ඉඩම බලයලත් මිනින්දෝරු පී. එම්. නෝනිස් විසින් සාදන ලද 1978.10.15 දිනැති අංක 7027 දරන පිඹුරේ විස්තර කළ ලොට් 1 වශයෙන් සඳහන් බෙදනලද්දාවූ නිශ්චිත ඉඩම් කැබැල්ල උතුරට : සත්තිවේල් සුප්පයියා, එල්. පී. එස්. පීරිස් සහ ජේ. ඩබ්. ප්‍රනාන්දු යන අයගේ ඉඩම් ද, නැගෙනහිරට : ජේ. ඩබ්. ප්‍රනාන්දු සහ ජේ. ඒ. ඩබ්. සී. පී. සිල්වා යන අයගේ ඉඩම් ද, දකුණට : ලොට් 2 සහ අඩි 8 ක් පළල පාරද, බස්නාහිරට : සාන්ත ඇන්ස් පාරේ 1 වෙනි පටුමගද මායිම්ව පර්චස් තිස්පහයි දශම හතරක (අ. 0, රූ. 0, පර්. 35.4) බිම් ප්‍රමාණය සමග එහි පිහිටි සියලු දේ වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එච් 38/103 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණපරිදි,

එම්. ඒ. ජී. කරුණාරත්න,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු,
(අයකරගැනීම්-ශාඛා).

ලංකා බැංකුව,
අයකර ගැනීම් ඒකකය-ශාඛා
අංක 04, ලංකා බැංකු මාවත,
කොළඹ 01,
2006ක් වූ අගෝස්තු මස 07 දින.

09-624

## සීමාසහිත සෙලාන් බැංකුව-කොග්ගල ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම කෝරළේ වැලිගම නගර සහා සීමාව තුළ පිහිටි වැලිගම මාතර පාර, හොම්පලවත්ත නමැති වරිපනම් අංක 450/6 දරන බලයලත් මිනින්දෝරු එස්. එල්. ගලප්පත්ති විසින් සාදන ලද 1992.08.30 දිනැති අංක4161 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන බී කැබැල්ලෙහි සම්පූර්ණ බිම, පළතුරු, ගස්, ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග බෙදා වෙන් කරන කැබලි අංක 03 ප්‍රමාණයෙන් පර්චස් දහඅටක් (අ. 0, රූ. 0, පර්. 18) විශල ඉඩම (මෙය මාතර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව ඩී 951/139 හි ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් ඉඩම තුළ උඩින් සහ දිගින් මාර්ග අයිතිය පාවිච්චි කිරීමේ අයිතිය සමග පෙර කී අංක 4161 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන පෙර කී මාතර පාර, හොම්පලවත්ත නමැති වරිපනම් අංක 450/6 දරන ඉඩමේ බි කැබැල්ලෙහි අංක 15 දරන සම්පූර්ණ ඉඩම් කොටස පර්චස් අටක් (අ. 0, රූ. 0, පර්. 8) විශාල ඉඩම (මෙය මාතර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව ඩී 952/31 හි ලියාපදිංචි කර ඇත)

මෙම දේපළ අංක 74/81, වල්ලිවල, වැලිගම සහ අංක 88 බොරාල පාර, වැලිගම හි පදිංචි පැලකැටියේ අරින්ද්‍ර සනත් කුමාර යන අය බන්ධනදායී වශයෙන් සීමාසහිත සෙලාන් බැංකුව වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැකුවට සුරක්ෂිත කර ඇත.

ඉහත සඳහන් දේපළ 2006 ඔක්තෝබර් මස 03 වැනි දින පස්වරු 1.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ඉඩමට පිවිසීම.*— වැලිගම බස් නැවතුම් පොලේ සිට සමරවීර පාරේ මීටර් 300 ක් ඉදිරියට ගොස් වමට ඇති අතුරු මාර්ගයේ මීටර් 400 ක් ඉදිරියට ගිය විට අදාල දේපළ පිහිටා ඇත. අඩි 10 ක් පළල ඇති මාර්ගයක් මෙම දේපළට අයත්ය. වරිපනම් අංක 450/6 මාතර පාර.

යෝජනා සම්මුති දැන්වීම රජයේ ගැසට් පත්‍රයේ 2006.01.06 දින ද, ලංකාදීප සහ ඩේලිමිරර් පත්‍රයේ 2005.11.14 වැනි දින ද, වීරකේෂරි පත්‍රයේ 2005.11.30 වැනි දින ද පළවී ඇත.

*ගෙවීමේ ක්‍රමය.*— සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය. ගැණුම් මිළෙන් 10% ක් (සියයට දහයක්), පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් 1% ක් වන පළාත් අධිකාරි බද්ද (සියයට එකක්), වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2000, ලිපිකර සහ සෝෂක වේතනය රු. 500, සියළුම ප්‍රචාරක වියදම් සහ ගැණුම් මිළෙන් ඉතිරි (සියයට අනූව) 90% විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත සීමාසහිත සෙලාන් බැකුවට ගෙවා නිම කල යුතුය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නීති) සීමාසහිත සෙලාන් බැංකුව, අංක 90, ගාලු පාර, කොළඹ 03,

දුරකථන 2456285, 2456263, 2456284.

ටී. ඇන්ඩ් එච් ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව,
දුරකථනය : 2696155, 2572940.

තුසිත කරුණාරත්න, (සාම විනිසුරු),
උසාවි කොමසාරිස් තක්සේරුකරු, සහ
බලයලත් වෙන්දේසිකරු.

09-639

---

## මහජන බැංකුව - මාතර උයන්වත්ත ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත, 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

මාතර නගර සහා සීමාව තුළ, හක්මණ පාරේ, ගබඩාවීදිය පිහිටි වරිපනම් අංක 28/3 දරන වටිනා ඉඩම සහ ගොඩනැගිලි.

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් 2006.09.19 දින පෙ. ව. 10.30ට ප්‍රසිද්ධ වෙන්දේසියේ දේපල පිහිටි ස්ථානයේ දී විකුණනු ලැබේ.

දේපල පිළිබඳ විස්තර.

. දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මාතර නගර සහා සීමාව සහ කඩවත් සතර තුළ ගබඩා වීදිය පිහිටි හක්මණ පාරේ, වරිපනම් අංක 28/3 දරන වේවැල්පොකුණවත්ත නැමති ඉඩම බෙදූ අංක 1 දරන ඉඩම් කැබැල්ල (පී. 13381 දරන බෙදුම් නඩුවට ගොනුකරන ලද) 1988.01.26 දිනැති, එම්. එච්. පී. සිරිවර්ධන බලයලත් මිනින්දෝරු මහතාගේ අංක 630 දරන පිඹුර සහ මැතදී මැන සාදන ලද 1989.05.08 දිනැති එම්. එච්. පී. සිරිවර්ධන බලයලත් මිනින්දෝරු මහතාගේ අංක 272 දරන පිඹුර ප්‍රකාර පර්චස් තිහක් (අක්. 0, රූ. 0, පර්. 30) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි වැවිලි ගොඩනැගිලි ආදී සියළු දෑ ද සමග අඩි 8 සහ 20ක් පළලැති අංක 272 දරන පිඹුරේ සඳහන් කැබලි අංක 4හි මාර්ග අයිතිය ද වේ. මෙම ඉඩම මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ. 428/82 යටතේ ලියාපදිංචි වී ඇත.

2. ඉහත කී ගබඩාවීදියේ හක්මණ පාරේ, වරිපනම් අංක 28/3 දරන වේවැල්පොකුණවත්ත නැමති ඉඩම බෙදූ අංක 1 දරන ඉඩම් කැබැල්ල (පී. 13381 දරන බෙදුම් නඩුවට ගොනුකරන ලද) 1988.01.26 දිනැති, එම්. එච්. පී. සිරිවර්ධන බලයලත් මිනින්දෝරු මහතාගේ අංක 630 දරන පිඹුර සහ මැතදී මැන සාදන ලද එකී බලයලත් මිනින්දෝරු මහතාගේ 1989.05.08 දිනැති අංක 272 දරන පිඹුර ප්‍රකාර පර්චස් දහයක් (අක්. 0, රූඩ්. 0, පර්. 10) විශාල

ඉඩම සහ ඒ තුළ පිහිටි වැව්ලි ගොඩනැගිලි ආදී සියලු දෑ ද අංක 272 පිඹුරේ සඳහන් කැබලි අංක 04 දරන අඩි 8ක් සහ 20ක් පළලැති පාරේ මාර්ග අයිතිය ද වේ. මෙම ඉඩම මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ. 428/83 යටතේ ලියාපදිංචි වී ඇත.

*රජයේ ගැසට් පත්‍රයේ* 2002.01.11 දින ද, දිනමිණ පුවත්පතේ 2002.11.02 දින පල කර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපලට පිවිසීම.*– මාතර හක්මණ පාරේ උයන්වත්ත මහජන බැංකුව පසුකර යාර 50ක් පමණ ගොස් නැවත දකුණට වැටී ඇති පාරේ තවත් යාර 25ක් පමණ ගියවිට මෙම දේපල හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.*– වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කල යුතුය. :

1. ගැණුම් මිලෙන් 10%ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක්,
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500ක්,
5. විකුණුම් වියදම සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත මහජන බැංකුව, මාතර ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ ප්‍රාදේශීය කළමනාකරු වෙත ගෙවිය යුතුය.

දුරකථන අංක 041-2222792, 2222822 හා 2224773
ෆැක්ස් අංකය 041-2222688

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි, සඳහන් කල මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත්, දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලින් 10%ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ජී. පී. ආනන්ද,
බලයලත් වෙන්දේසිකරු,
උසාවි කොමසාරිස් හා තක්සේරුකරු.

කුරුඳුවත්ත,
වල්ගම, මාතර.
දුරකථන අංක : 041-2228731

09-649